# කාර්ය සාධන වාර්තාව

# வருடாந்தச் செயலயாற்றுகை அறிக்கை

# ANNUAL PERFORMANCE REPORT

# 2022

කර්මාන්ත අමාත්‍යාංශය

கைத்தொழில் அமைச்சு

**Ministry of Industries**

# 2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

**කර්මාන්ත අමාත්‍යාංශය**

**වැය ශීර්ෂ අංකය:149**

**මෙම වාර්තාව දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට ද පරිවර්තනය කර ඇත.**

# පටුන


| | පිටුව |
|---|---|
| හැඳින්වීම | V |
| පරිච්ඡේදය 01: ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 1 - 6 |
| පරිච්ඡේදය 02: ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 7 - 26 |
| පරිච්ඡේදය 03: වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය | 27 - 38 |
| පරිච්ඡේදය 04: කාර්ය සාධන දර්ශකය | 39 - 42 |
| පරිච්ඡේදය 05: තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය | 43 - 46 |
| පරිච්ඡේදය 06: මානව සම්පත් පැතිකඩ | 47 - 56 |
| පරිච්ඡේදය 07: අනුකූලතා වාර්තාව | 57 - 66 |
| ඇමුණුම් | i -xiv |

# හැඳින්වීම

කර්මාන්ත අමාත්‍යාංශයේ 2022 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2/2020 මඟින් දෙන ලද උපදෙස් අනුව පිළියෙල කර ඇත.

මෙම වාර්තාවේ පළමු පරිච්ඡේදය තුලින් අමාත්‍යාංශයේ ආයතනික පැතිකඩ සහ ක්‍රියාවට නැංවීමේ සාරාංශය දක්වා ඇත. ඒ අනුව අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර, අරමුණු, සංවිධාන ව්‍යුහය, අමාත්‍යාංශය යටතේ පවතින අංශයන් සහ අමාත්‍යාංශය යටතට අයත් වන සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, දෙපාර්තුමේන්තු සහ ව්‍යාපෘති වලට අදාළ තොරතුරු සංක්ෂිප්තව ඇතුලත් කර ඇත.

අමාත්‍යාංශය යටතේ පවතින අංශ, සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, දෙපාර්තුමේන්තු සහ ව්‍යාපෘති මඟින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය සහ ඉදිරි සැලසුම් දෙවන පරිච්ඡේදය මගින් සවිස්තරාත්මකව දක්වා ඇත .

තුන්වන පරිච්ඡේදය මඟින් අමාත්‍යාංශයේ 2022 වර්ෂයේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳව තොරතුරුද අමාත්‍යාංශයේ ක්‍රියාකාරි සැලැස්ම මත පදනම් වූ කාර්ය සාධන දර්ශකයක් අනුව ලගා කරගෙන ඇති ප්‍රගතිය හතර වන පරිච්ඡේදය තුලින් සංක්ෂිප්තව දක්වා ඇත.

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා අමාත්‍යාංශය දක්වන ලද දායකත්වය පිළිබඳව සංක්ෂිප්ත වාර්තාව පස්වන පරිච්ඡේදය මඟින් දක්වා ඇත.

හයවන පරිච්ඡේදය මගින් අමාත්‍යාංශයේ මානව සම්පත් පැතිකඩ දක්වා ඇති අතර ඒ තුලින් අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යාව, ක්‍රියාත්මක කරන ලද මානව සම්පත් සංවර්ධන වැඩසටහන් පිළිබඳව තොරතුරු සංක්ෂිප්තව දක්වා ඇත.

ඉහත චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘති පත්‍රය පරිදි ලබා ගැනීමට අපේක්ෂිත වූ කාර්ය සාධනය පිළිබඳව වූ අනුකූලතා වාර්තාව හත්වන පරිච්ඡේදය මගින් දක්වා ඇත.

# පරිච්ඡේදය 01

## ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

"ගෝලීයව තරඟකාරී, තිරසර සහ සුවිශේෂී ශ්‍රී ලාංකීය නිෂ්පාදන කර්මාන්ත අංශයක්"


### මෙහෙවර

"තාක්ෂණය, දැනුම සහ නවෝත්පාදන චින්තනය මත පදනම් වූ හිතකර පරිසරයක් නිර්මාණය තුලින් විවිධාංගීකරණය වූ, ඉහළ අගය එකතු කළ, නව්‍ය කාර්මික නිෂ්පාදන, පරිසර හිතකාමී ක්‍රමවේදයන් භාවිතය, ඉහළ වෙළෙඳපල ප්‍රවේශ අවස්ථා සහ සැමට ප්‍රතිලාභ ලැබෙන කර්මාන්ත සංවර්ධනයක් තහවුරු කිරීම."


### අරමුණු

- නිෂ්පාදන කර්මාන්ත අංශයේ සියළුම පාර්ශවකරුවන් සඳහා කාර්යක්ෂම සේවාවක් සැපයීම උදෙසා හිතකර ව්‍යුහයක් ගොඩනැගීම.
- නිෂ්පාදන කර්මාන්ත අංශයේ තාක්ෂණ භාවිතාවන්, අගය එකතු කිරීම, නිෂ්පාදන විවිධාංගීකරණය, දේශීය සම්පත් භාවිතය සහ තිරසර බව ඉහළ නැංවීම.
- සැමට ප්‍රතිලාභ සලසන කාර්මික සංවර්ධනයක් සහතික කිරීම සඳහා ප්‍රාදේශීය කාර්මික සංවර්ධනය ප්‍රවර්ධනය සහ ආයෝජන අවස්ථා පුළුල් කිරීම.
- කර්මාන්ත අංශයේ දේශීය සහ ගෝලීය වෙළෙඳපොල ප්‍රවේශය ඉහළ නැංවීම.

## 1.2 ආයතනික ව්‍යුහය 1



# 1.2 ආයතනික ව්‍යුහය 2



## 1.3. අමාත්‍යාංශය යටතේ පවතින අංශ සහ ආයතන

**අංශ**

01. ප්‍රතිපත්ති හා සංවර්ධන අංශය
02. කර්මාන්ත සංවර්ධන අංශය
03. සංවර්ධන අංශ I
04. සංවර්ධන අංශ II
05. සංවර්ධන අංශ III
06. කර්මාන්ත ලියාපදිංචි අංශය
07. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
08. පොදු ව්‍යාපාර හා ප්‍රතිව්‍යුහගතකරණ අංශය
09. පේෂ කර්මාන්ත හා දේශීය ඇඟළුම් නිෂ්පාදන ප්‍රවර්ධන අංශය
10. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත අංශය
11. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශය

**අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා**

01. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB)
02. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)
03. කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් (KGLL)
04. ලංකා පිඟන් සංස්ථාව (ගඩොල් සහ උළු අංශය) (CCC)
05. පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ් (PCCL)
06. ලංකා ඛනිජ වැලි සමාගම (LMSL)
07. ජාතික ලුණු සමාගම (NSL)
08. බී.සී.සී.සමාගම (BCC)
09. ජාතික කඩදාසි සමාගම (NPCL)
10. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව (SLCC)
11. සී/ස ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම (LAL)
12. ලංකා ලේලන්ඩ් සමාගම (LLL)
13. ජාතික මෝස්තර මධ්‍යස්ථානය (NDC)
14. පේෂකර්ම දෙපාර්තමේන්තුව (DTI)
15. ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය (SLITA)
16. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) (SLHB)
17. ජාතික ශිල්ප සභාව (NCC)
18. සීමාසහිත ලංකා සළුසල (LSL)
19. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA)
20. මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය (GJRTI)
21. සීමා සහිත ලංකා පොස්පේට් සමාගම (LPL)
22. විද්‍යාතා මධ්‍යස්ථානය
23. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තුමේන්තුව (ROC)
24. කාර්මික තාක්ෂණ ආයතනය (ITI)

# පරිච්ඡේදය 02

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 ප්‍රතිපත්ති සංවර්ධන අංශය

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

- කර්මාන්ත සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය (NaPID) සකස් කර ඇත. අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතී.
- 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනතෙහි සංශෝධනයන් නීතිපති දෙපාර්තමේන්තුවට යැවීම සඳහා වන මූලික කෙටුම්පත අවසන් කර ඇත.
- ශ්‍රී ලංකාවේ මෝටර් රථ නිෂ්පාදනය / එකලස් කිරීම සහ සංරචක නිෂ්පාදනය සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටිය (SOP) යටතේ වසර තුල මෝටර් වාහන 10,490 (සිව්රෝද 8,184 සහ ද්වීරෝද 2,306) එකලස් කර ඇත.
- ප්‍රතිපත්ති සංවර්ධන අංශය,අවම වශයෙන් 30% ක දේශීය අගය එකතු කිරීමක් සහිත (HS පරිච්ඡේද 84 සහ 85 යටතේ) දේශීයව නිෂ්පාදිත විදුලි උපකරණ සඳහා නිෂ්පාදන බද්දෙන් නිදහස් කිරීම සඳහා අනෙකුත් අදාළ ආයතන සමඟ සහයෝගයෙන්, නිර්දේශ ලබා දීම සිදු කර ඇත.
- කර්මාන්ත අංශ සමඟ අඛණ්ඩව සාකච්ඡා පවත්වන අතර මුදල් අමාත්‍යාංශය හරහා තීරුබදු සම්බන්ධ ගැටලු විසඳීම සඳහා සහාය ලබා දෙයි.
- කාර්මික සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා වූ උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

**ඉදිරි සැලසුම්**

- ප්‍රතිපත්ති සංවර්ධන අංශය දේශීයව මෝටර් රථ එකලස් කිරීමේදී මෝටර් රථ එකලස් කරන්නන් සහ නිෂ්පාදකයින් මුහුණ දෙන ගැටළු සහ අත්දැකීම් මත පදනම්ව 2023 වන විට සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටිය (SOP) සමාලෝචනය කිරීමට සැලසුම් කර ඇත.

- දේශීය මෝටර් රථ නිෂ්පාදන සහ එකලස් කිරීමේ කර්මාන්තයේ මෙන්ම මෝටර් රථ උපාංග නිෂ්පාදන කර්මාන්තයේ නියැලීම සඳහා දේශීය සමාගම් සමඟ හවුල් ව්‍යාපාර මගින් විදේශීය හා දේශීය ආයෝජන දිරිමත් කිරීම.

## 2.2 කර්මාන්ත සංවර්ධන අංශය

**ප්‍රගතිය/ජයග්‍රහණ**

- අමාත්‍යාංශය විසින් දිවයින පුරා දිස්ත්‍රික්ක 20ක විදුලිය, ජලය සහ මාර්ග වැනි යටිතල පහසුකම් සහිත අක්කර 1,069.52 ක ඉඩම් ප්‍රමාණයක් සංවර්ධනය කර කර්මාන්තපුර 33 ක් ස්ථාපිත කර ඇත.

- එම කර්මාන්තපුර 33හි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රජය විසින් රු. මිලියන 3,980.05 පමණ වැය කර ඇති අතර ඊට අමතරව ඉහත සඳහන් කර්මාන්තපුරවල කර්මාන්තශාලා පිහිටුවීම සඳහා පෞද්ගලික අංශය විසින් රු. මිලියන 56,480.70 ක් වියදම් කර ඇත.

- කර්මාන්ත සංවර්ධන වැඩසටහන යටතේ 2022 වර්ෂය තුල වාණිජ කටයුතු ආරම්භ කරන ලද ආයතන සංඛ්‍යාව 469 වන අතර රැකියා අවස්ථා 21,914 ක් මෙමගින් බිහි කොට ඇත.

- අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද කර්මාන්තපුර වලින් ඉඩම් වෙන් කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව 41 කි.

- උලපනේ කර්මාන්තපුරයේ වැට සහ මාර්ග බාධකය සහ ගේට්ටුව අළුත්වැඩියා කිරීම අවසන් කර ඇත.

- බුත්තල කර්මාන්තපුරයේ ජලනල පද්ධතිය අළුත්වැඩියා කිරීම අවසන් කර ඇත.

- කළුතර කර්මාන්තපුරයේ අභ්‍යන්තර මාර්ග ඉදි කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල මාර්ග සංවර්ධන අධිකාරිය ගෙවා අවසන් කර ඇත.

- කටුනායක කර්මාන්තපුරයේ වැට ඉදි කිරීම අවසන් කර ඇත.

- එරාවූර් කර්මාන්ත කලාපයේ -

  අප ජලය මුහුදට බැහැර කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු 98% ක් නිම කර ඇත.
  විදුලිබලය ලබා දීමේ කටයුතු 98% ක් අවසන් කර ඇත.
  පිවිසුම් මාර්ග සංවර්ධනය 75% ක් නිම කර ඇත.
  ජල සැපයුම සඳහා ජලනල සවි කිරීම 95% අවසන් කර ඇත.

**ඉදිරි සැලසුම්**

- ප්‍රාදේශීය කර්මාන්තපුර සංවර්ධන වැඩසටහන යටතේ නව කර්මාන්තපුර 02ක් ඉදි කිරීම කටයුතු අරඹිහ කිරීමට අපේක්ෂිතයි.

- ප්‍රාදේශීය දිස්ත්‍රික් මට්ටමෙන් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කලාප ස්ථානගත කිරීමේ ජාතික වැඩසටහන යටතේ තෝරාගත් ඉඩම් කොටස් 10 ක යටිතල පහසුකම් සංවර්ධන කටයුතු අවසන් කර සුදුසු ආයෝජකයන් වෙත ලබා දීමට නියමිතයි.

## 2.3 ආංශික සංවර්ධන අංශ

### සංවර්ධන අංශ I

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

- Profood Propack ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය දේශීය හා විදේශීය කර්මාන්ත ප්‍රදර්ශකයින් 225 දෙනෙකු සහභාගීත්වයෙන් ප්‍රදර්ශන කුටි 280කින් සමන්විතව ආහාර නිෂ්පාදනයේ නියුක්ත සුළු හා මධ්‍ය පරිමාන කර්මාන්ත හිමියන් සඳහා විශේෂ ප්‍රදර්ශන මණ්ඩපයක්ද ඇතුලත්ව වෙළඳ ප්‍රදර්ශනය සාර්ථකව නිම කිරිම.

- ලංකා ඇසුරුම් ප්‍රදර්ශනය (Lanka pack Exhibition) දේශීය හා විදේශීය ප්‍රදර්ශන කුටි 75කින් හා නරඹන්නන් 7500 දෙනෙකුගෙන් සමන්විතව සාර්ථකව පවත්වන ලදී.

- ප්‍රතීතන ආහාර රසායනාගාර ව්‍යාපෘතියේ රසායනාගාර ගොඩනැගිල්ලේ පළමු හා දෙවන මහල සඳහා විදුලි සැපයුම් සම්පූර්ණ කර නිම කිරීම හා ආහාර නිෂ්පාදන කර්මාන්ත 206ක සාම්පල් පරීක්ෂාව සිදුකර අවසන් කිරීම.

- ඇසුරුම් කර්මාන්ත අංශයේ තෝරාගත් කර්මාන්තවල සේවයේ නියුතු සේවකයින් 25දෙනෙකු සඳහා ඇසුරුම් තාක්ෂණය පිළිබඳ වූ සහතිකපත්‍ර පුහුණු පාඨමාලාව ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනය හා එක්ව ක්‍රියාත්මක කර සාර්ථකව නිම කිරීම.

- ආහාර සැකසුම්කරුවන් සහ අපනයනකරුවන්ගේ කාබනික නිෂ්පාදන සහතිකකරණය සඳහා මූල්‍ය සහය වැඩසටහන යටතේ කර්මාන්ත 25ක් තෝරාගන්නා ලද අතර සහතිකකරණ ක්‍රියාවලිය කර්මාන්ත 14ක් විසින් අවසන් කර ඇති අතර ඉතිරි කර්මාන්ත අවසන් අදියරයේ පවතී.

**අභියෝග**

- දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොල තරඟකාරීත්වයට මුහුණ දියහැකි ගුණාත්මකභාවයෙන් යුතු සෞඛ්‍යාරක්ෂිත ආහාර නිෂ්පාදනයන් සඳහා දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.

- දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොල සඳහා ආහාර නිෂ්පාදන වල ගුණාත්මකභාවය උසස් කිරීම, රසායනාගාර පරීක්ෂණ පහසුකම් සැපයීම තුලින් ව්‍යවසායකයන් ප්‍රවර්ධනය කිරීම.

- උසස් ගුණත්වයෙන් යුතු අගය එකතු කරන ලද දේශීය ඇසුරුම් නිෂ්පාදිත වලින් අනෙකුත් කර්මාන්ත නිෂ්පාදන සඳහා අවශ්‍ය ඇසුරුම් සහ අපනයන භාණ්ඩ සඳහා අවශ්‍ය ඇසුරුම් සපුරා ගැනීම.

**ඉදිරි ඉලක්ක**

- ඉහල ගුණාත්මක තත්වයෙන් යුතු නිෂ්පාදන දේශිය හා විදේශිය වෙළඳපොල සඳහා ඉදිරිපත් කිරීම.
- ඉහල ගුණත්වයකින් සහ ධාරිතාවයකින් ඇසුරුම් නිෂ්පාදනය කිරිම සඳහා ඇසුරුම් කර්මාන්ත පෙළඹවීම.
- නිෂ්පාදන කර්මාන්ත අංශයන්ගේ ඵලදායිතාවය වැඩි කිරීමට සේවා නියුක්ත ශ්‍රමිකයන්ගේ කාර්යක්ෂමතාව ඉහල නැංවීම සඳහා දේශිය හා විදේශිය පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- වෙළඳපොල තරඟකාරීත්වය සහ තිරසාරත්වය ඉහළ නැංවීම තුලින් අදායම් හා රැකියා උත්පාදන අවස්ථා ඉහල නැංවීම හා එම කර්මාන්ත වල ඵලදායීතාව වැඩිදියුණු කිරිම සඳහා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම.
- දේශිය වශයෙන් ජාත්‍යාන්තර ප්‍රදර්ශන සංවිධානය කිරිම තුලින් දේශීය කර්මාන්ත වලට අවශ්‍ය නව තාක්ෂණය හඳුන්වාදීම සහ එම කර්මාන්ත සඳහා දේශීය හා විදේශිය වෙළපොල සකස් කර ගැනීමට සහය විම.

## සංවර්ධන අංශ II

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

- මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තයේ නිෂ්පාදනයන්හි ප්‍රමිතිය ඉහළ නැංවීම සඳහා ජාත්‍යාන්තර පිළිගත් IATF 16949 (International Automotive Task Force) තත්ව සහතිකය ලබා ගැනීම සඳහා දේශීය වාහන උපාංග නිෂ්පාදන කර්මාන්තකරුවන් 3 දෙනෙකු සඳහා පහසුකම් සපයා ඇත.

**අභියෝග**

- ආනයනික අමුද්‍රව්‍ය සඳහා සමහර තීරුබදු සහ සෙස් ගැටළු පැවතීම.
- අධික බලශක්ති පිරිවැය සහ ඉන්ධන මිල  ඉහල යාම.
- ක්‍රියාවලි සංවර්ධනය සහ අගය එකතු කිරීම සඳහා තාක්ෂණික සහාය ප්‍රමාණවත් නොවීම.
- පර්යේෂණ හා සංවර්ධනය සඳහා වෙන් කෙරෙන මුදල ප්‍රමාණවත් නොවීම.
- ප්‍රධාන අපනයන නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ අහිමි වීම.
- රජයේ ආයතන අතර දුර්වල සම්බන්ධීකරණය.
- නිමි භාණ්ඩ නීති විරෝධී ක්‍රමයක් ඔස්සේ ආනයනය කිරීම.

**ඉදිරි ඉලක්ක**

- වාහන උපාංග නිෂ්පාදන කර්මාන්ත අංශය සඳහා හඳුන්වා දෙන IATF 16949 (International Automotive Task Force) තත්ව සහතිනය 2023 වසර තුළ කර්මාන්ත ආයතන 15ක් සඳහා හඳුන්වා දීමට නියමිතය.
- රතු මැටි සෙවිලි උළු සඳහා SLSI ප්‍රමිති සහතික ලබා ගැනීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් 20 ක් සඳහා සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාව ඇගයීම් සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- රබර් හා ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ නියුතු තාක්ශණ ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- රබර් හා ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත අංශය සඳහා Polymer Technology සම්බන්ධ උපාධි මට්ටමේ පාඨමාලාවක් පැවැත්වීම.
- දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ නියුතු තාක්ෂණ ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- බෝට්ටු නිෂ්පාදන අංශය සඳහා වූ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයක් පැවැත්වීම.
- විදුලි හා විද්‍යුත් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත සඳහා අන්තර්ජාතික ප්‍රමිති සහතික ලබා ගැනීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- මාලදිවයින/ඉන්දියාව/සීෂෙල්ස් සමඟ කලාපීය වෙළෙඳ පොළෙන් බෝට්ටු සඳහා ඇති ඉල්ලුම ඉහළ නැංවීම සඳහා ඒකාබද්ධ නාවික සංචාරක වැඩසටහන ප්‍රවර්ධනය කිරීමේ අවස්ථා පිළිබඳ කලාපීය සමුළුවක් සංවිධානය කිරීම.

## සංවර්ධන අංශ III

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

- ශ්‍රී ලංකාවේ “වාෂ්ප ජනක යන්ත්‍ර සහ පීඩන ග්‍රාහක පර්යේෂණ, සංවර්ධන සහ නියාමන මධ්‍යස්ථානය” පිහිටුවීමට මෙම මධ්‍යස්ථානය සඳහා එහි අරමුණු බලතල ක්‍රියාකාරිත්වය සහිත අදාල වාර්තාව සකසා අවසන් කර ඇත.
- ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් කර්මාන්ත අමාත්‍යාංශය හා එක්ව කර්මාන්ත ක්ෂේත්‍රයේ කර්මාන්තකරුවන් ඇගයීමට, දිරිමත් කිරීමට හා දේශිය නිෂ්පාදන ඇගයීමට ශ්‍රී ලංකා කර්මාන්ත ප්‍රදර්ශනයක් හා සම්මාන උළෙලක් BMICH හිදී පවත්වන ලදී.
- කොළඹ දිස්ත්‍රික්කය තුළ පාවහන් හා සම් ආශ්‍රිත නිෂ්පාදන සඳහා මානව සම්පත් දියුණු කිරීම හා පුහුණු වැඩසටහන පවත්වන ලදී. මෙම ව්‍යාපෘතිය මගින් ඍජුව ප්‍රතිලාභ ලබාගත් පිරිස 124කට ආසන්න වේ.

- ලංකා කාර්මික මණ්ඩලය හා එක්ව ලෝහ ආශ්‍රිත කර්මාන්තවල අගය එකතු කිරීමේ සූත්‍රයක් සකස් කිරීම සහ ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට පාර්ශවකරුවන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කර ඇත.
- ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය විසින් අමාත්‍යාංශයේ දායකත්වයද සහිතව වසරේ විශිෂ්ඨතම කර්මාන්තකරුවන් ඇගයීමේ සම්මාන උළෙල (CNCI Achievers Awards) දෙසැම්බර් 20 වෙනි දින පවත්වන ලදී.

**ඉදිරි ඉලක්ක**

- ලෝහ ආශ්‍රිත කර්මාන්ත ආයතනවල දේශිය සේවා නියුක්තිය වර්ධනය කිරීම සඳහා පාඨමාලා පැවැත්වීම.
- NEDA හා IDB ආයතන හරහා පුහුණු වන ප්‍රජාවට කර්මාන්ත ආරම්භ කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීමට සැලසුම් කර ඇත.
- දේශීය රූපලාවන්‍ය ආයතන සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය ආනයනය කිරීමට අයකරන බදු සඳහා සහන ලබා දී දේශීය කර්මාන්ත නගා සිටුවීමටත් එම අංශය වැඩි දියුණු කිරීම සඳහා හැකියාව සහිත ව්‍යවසායකයින් වෙත නව තාක්ෂනය හඳුන්වා දෙමින් නව වෙළඳපොල අවස්ථා ලබා දීමට සහ එමගින් විදේශ විනිමය රට තුල ඉතිරි කර ගැනීමට අපේක්ෂිතය.
- හඳුන්කූරු නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍යක් වශයෙන් යොදා ගන්නා විශේෂිත උණබට කූරු 100%ක් දේශිය නිෂ්පාදනය කිරීම සහ හඳුන්කූරු සඳහා අවශ්‍ය උණ ශාකය දේශියව වගාකිරීමට අවශ්‍ය පටක චීනයෙන් ආනයනය කිරීමට කටයුතු කිරීමට අපේක්ෂිතය.
- සම් හා පාවහන් ප්‍රදර්ශනය පැවැත්වීමට අපේක්ෂිතය.
- දිවයින පුරා සිටින රැකියා විරහිත නුපුහුණු තරුණ ප්‍රජාව සහ කාන්තා පාර්ශවය වෙනුවෙන් පාවහන් නිෂ්පාදනය ආශ්‍රිත කුසලතා වර්ධන වෙනුවෙන් මූලික පුහුණු පාඨමාලා පැවැත්වීමට SLITA ආයතනය සමඟ එක්ව කටයුතු කිරීමට අපේක්ෂිතය.
- පසුගිය වසරවලදී පාවහන් හා සම්භාණ්ඩ නිෂ්පාදනයට පිවිසී සිටින්නන් වෙනුවෙන් උසස් පුහුණු පාඨමාලා පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත.
- පාවහන් සම් භාණ්ඩ නිෂ්පාදනයේ දැනට යෙදී සිටින නිෂ්පාදකයන් අපනයන වෙළඳපොල වෙත යොමු කිරීම ව්‍යාපෘතියක් සැලසුම් කිරීමට අපේක්ෂිතයි.
- සුළු හා මධ්‍ය පරිමාණ අංශයේ සම් හා පාවහන් පර්යේෂණය හා සංවර්ධනය පුළුල් කිරීම සඳහා වන නවෝත්පාදන සඳහා පහසුකම් සැලසීම.
- කර්මාන්තකරුවන් සඳහා ජාත්‍යාන්තර කර්මාන්ත හා වෙළඳ ප්‍රදර්ශන වලට සහභාගී වීමට අවශ්‍ය පහසුකම් ලබා දීමට සැලසුම් කර ඇත.
- විශ්ව විද්‍යාල ආචාර්යවරුන් හා උපාධිධාරී අපේක්ෂකයින් එක් කර කර්මාන්ත අංශය දියුණුකිරීම සඳහා ශක්‍යතාවයක් ඇති පර්යේෂණ වාණිජකරණය සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට සම්මන්ත්‍රණ (symposium) පැවැත්වීමට අපේක්ෂිතය.

## කර්මාන්ත ලියාපදිංචි අංශය

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

- කර්මාන්ත අමාත්‍යාංශය යටතේ 2022 දෙසැම්බර් 31 දක්වා නිෂ්පාදන කර්මාන්ත 3451ක් ලියාපදිංචි කර ඇත.
- මැනුවල් ක්‍රමය ඔන්ලයින් පද්ධතියක් බවට පත් කිරීමට පියවර ගෙන ඇති අතර පද්ධතිය සංවර්ධනය කරමින් පවතී.

**අභියෝග**

- මෙරටේ ක්‍රියාත්මක වන සියලු නිෂ්පාදන කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි නොවීම හා ඒ පිළිබඳව නිවැරදි දත්ත නොමැති වීම.
- නියාමන පද්ධතියක් නොමැති නිසා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ අපහසුතා.
- කර්මාන්ත ලියාපදිංචිය ලබා ගැනීම සඳහා කර්මාන්තකරුවන්ට පහසුකම් සැලසීම හෝ ඔවුන් දැනුවත් කිරීම අවශ්‍ය වීම.
- කර්මාන්තකරුවන්ට පහසුකම් සපයන රාජ්‍ය හා රාජ්‍ය නොවන සියලු ආයතන හා සම්බන්ධීකරණය කරමින් කර්මාන්ත ව්‍යවසායකයන් ලියාපදිංචි කිරීමේ සහතිකය හෙවත් බලපත්‍රය සියලු ආයතනයන්ට අත්‍යවශ්‍ය නොකිරීම හේතුවෙන් ලියාපදිංචි වීම අවම අගයක් ගෙන ඇත.

**ඉදිරි ඉලක්ක**

- අමාත්‍යාංශයේ සමස්ත කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා මාර්ගගත ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම.
- මුළු රටම ආවරණය වන පරිදි විස්තීර්ණ ජාතික දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ සමාජ මාධ්‍ය හරහා කර්මාන්ත ලියාපදිංචිය ප්‍රවර්ධනය කිරීම.
- කාර්තුවකට නිෂ්පාදන කර්මාන්ත 100 ක් ලියාපදිංචි කිරීම සහ 2023 ඇතුළත කර්මාන්ත ලියාපදිංචි කිරීම් 549 ක් සම්පූර්ණ කිරීමට අපේක්ෂිතයි.
- 1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනත සංශෝධනය කර කර්මාන්ත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව හා කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීමට සැළසුම් කොට ඇත.

## 2.4 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා වන නව ව්‍යාපෘති

### I. කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය (SMILE III-Revolving Funds)

**ප්‍රගතිය/ජයග්‍රහණ**

මෙම අරමුදලෙන් නව ව්‍යාපාර ආරම්භ කිරීම, පවතින ව්‍යාපාරවල ඵලදායිතාව වර්ධනය කිරීම, එකී ආයතනවල ක්‍රියාකාරිත්වය සහ නිෂ්පාදනවල ගුණත්වය වර්ධනය කිරීම සඳහා අඩුපොලී අනුපාත යටතේ ණය ලබාදෙයි. එමෙන්ම මෙම ණය යෝජනා ක්‍රමයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල ආයතන ධාරිතාවය සහ නිෂ්පාදන වල වර්ධනයක් ඇති කිරීම සඳහාද ණය ලබාදෙයි. මෙම ණය යෝජනා ක්‍රමය මුදල් අමාත්‍යාංශයේ උපදෙස් අනුව 2013 වසරේ මැයි 01 දින සිට ඉහත අරමුණු සඳහා ක්‍රියාත්මක කරයි.

සමාලෝචිත කාලය පරිච්ඡේදය තුල ව්‍යාපෘති කළමනාකරණ ඒකකය උප ව්‍යාපෘති 79කට රුපියල් මිලියන 533 මුදා හරින ලදි.

- වසරට කළ වෙන් කිරීම - රුපියල් මිලියන 600
- වියදම - රුපියල් මිලියන 533

### II.පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II (E-Friend II)

**ප්‍රගතිය/ජයග්‍රහණ**

කාර්මික නිෂ්පාදන ක්‍රියාවලිය තුලින් සිදුවන පරිසර දූෂණය සහ අපද්‍රව්‍ය අවම කිරීම, සම්පත් ප්‍රතිසාධනය සහ සුරැකීම, පරිසර දූෂණය පාලනය සහ අවම කිරීම වැනි කටයුතු සඳහා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යවසායකයින්ට සහන පොළී අනුපාතයක් යටතේ ණය මුදල් ලබා දෙයි. එමෙන්ම ජාතික පරිසර පනතේ දැක්වෙන ප්‍රමිතීන්ට අනුකූලවීම සඳහා අවශ්‍ය මූලික ක්‍රමෝපායන් ආරම්භ කිරීම සඳහා ද මෙම ණය යෝජනා ක්‍රමය මූල්‍ය සහාය ලබා දෙනු ලැබේ. මෙම ණය යෝජනා ක්‍රමය මුදල් අමාත්‍යාංශයේ උපදෙස් අනුව 2018 සිට ඉහත අරමුණු සඳහා ක්‍රියාත්මක කරයි.

සමාලෝචිත කාලය තුල ව්‍යාපෘති කළමනාකරණ ඒකකය උපව්‍යාපෘති 15 සඳහා රුපියල් මිලියන 232.2 ක් මුදාහරින ලදි.

- වසරට කල වෙන් කිරීම - රුපියල් මිලියන 250
- වියදම - රුපියල් මිලියන 232.2

**ඉදිරි සැලසුම්**

- ඉදිරි වසරේදී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය යටතේ උප ව්‍යාපෘති 202කට රුපියල් මිලියන 2,000 ක් ණය වශයෙන් නිකුත් කිරීමට අපේක්ෂා කරන අතර ඒ තුළින් රැකියා අවස්ථා 1500 ජනිත කිරීමට අපේක්ෂිතයි.
- E- Friend II යටතේඋප ව්‍යාපෘති 48 කට 2023 වසරේ රුපියල් මිලියන 1000ක් ණය වශයෙන් ලබා දීමට අපේක්ෂා කරයි.

## 2.5. ප්‍රතිව්‍යුහගතකරණ අංශය

**ප්‍රගතිය/ජයග්‍රහණ**

- ලංකා ඛනිජවැලි සමාගම නව අලෙවි ක්‍රම වේදයක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ඒයටතේ ඛනිජවැලි අලෙවි කිරීම සිදු කරමින් පවතී.
- සී/ස ජාතික කඩදාසි සමාගමේ ඇඹිලිපිටිය කර්මාන්තශාලාව රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ නැවත ආරම්භ කර ඇත.

**ඉදිරි ඉලක්ක**

- කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාවේ ඇති අබලි යකඩ ප්‍රසම්පාදන පටිපාටිය අනුව ටෙන්ඩර් කිරිමේ කටයුතු අවසන් කිරීමට අපේක්ෂිතයි.
- කහටගහ ග්‍රැෆයිඩ් ලංකා ලිමිටඩ් ආයතනයේ මිනිරන් අලෙවිය සඳහා නව අලෙවි ක්‍රමවේදයක් හඳුන්වාදීමට අපේක්ෂිතයි.
- කහටගහ පතල් පරිශ්‍රයේ Forth Flotation Plant ස්ථාපිත කිරීමට නියමිතය.

## 2.6. පේෂ කර්මාන්ත හා දේශීය ඇඟළුම් නිෂ්පාදන ප්‍රවර්ධන අංශය

**ප්‍රගතිය/ජයග්‍රහණ**

**බතික් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන**

- ත්‍රෛමාසික පුහුණු වැඩසටහන් 25 ක් මධ්‍යස්ථාන 25 ක දී පවත්වා බතික් නිෂ්පාදකයන් 500 ක් පුහුණු කර ඇත.

**අත්යන්ත්‍ර පේෂකර්ම ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන**

- දකුණු පළාතට - අත්යන්ත්‍ර 11
- උතුරු පළාතට- අත්යන්ත්‍ර 20, warping machines 2, electric winding machines 2, Bobbin Machine කට්ටල 15
- මධ්‍යම පළාතට - අත්යන්ත්‍ර , යන්ත්‍ර සූත්‍ර කොටස් ලබා දී ඇත.

**රෙදිපිළි අලෙවි ප්‍රවර්ධන වැඩසටහන**

- දේශීය රෙදිපිළි අලෙවි කිරීමේ ප්‍රදර්ශන 05 ක් පවත්වා ඇත.

**අභියෝග**

- දියුණු තාක්ෂණ භාවිතය අඩු වීම නිසා ඵලදායිතාව හා ගුණාත්මකභාවය අඩු භාණ්ඩ නිෂ්පාදන වීම.
- අමුද්‍රව්‍ය හිගය සහ අමුද්‍රව්‍ය මිල අධික බැවින් බොහෝ කර්මාන්ත ගෘහාශ්‍රිත කර්මාන්ත වීම.
- කර්මාන්තයේ නියෙලෙන්නන් සඳහා ලැබෙන ණය පහසුකම් ප්‍රමාණාත්මක නොවීම.
- තරුණ පරපුර බතික් සහ අත්යන්ත්‍ර කර්මාන්තයේ නියැලීමට ඇති අකමැත්ත සහ උනන්දුවක් නොදැක්වීම.

**ඉදිරි සැලසුම්**

බතික් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන

- පුහුණු මධ්‍යස්ථාන 20 ක් නිෂ්පාදන මධ්‍යස්ථාන බවට පත් කිරීම.
- නිෂ්පාදකයින් 100 කට උසස් තාක්ෂණ පුහුණුව ලබා දිම
- මධ්‍යස්ථාන 02 කට හා තනි පුද්ගල ප්‍රතිලාභින් 20 දෙනෙකුට අප ජල කළමනාකරණ ඒකක ලබා දීමටත් අපේක්ෂිතයි.

**අත් යන්ත්‍ර පේෂකර්ම ගම්මාන වැඩසටහන**

- පොදු පහසුකම් මධ්‍යස්ථාන 5 ක හා ප්‍රතිලාභින් 100 නවීන උපකරණ ලබා දීම, වියන යන්ත්‍ර සහ අනෙකුත් උපකරණ ලබා දීම මෙන්ම තෝරාගත් අත් යන්ත්‍ර රෙදි නිෂ්පාදකයින් 100 දෙනෙකු සඳහා නවීන මෝස්තර නිර්මාණ උසස් පුහුණුව ලබා දීමටත් අපේක්ෂිතයි.

**බතික් සහ අත්යන්ත්‍ර ක්ෂේත්‍ර සඳහා පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

- ස්වභාවික ඩයි වර්ග හා නිෂ්පාදන ක්‍රියාවලිය හඳුනාගැනීම, ස්වභාවික නූල් නිෂ්පාදනය හා නියමු ව්‍යාපෘතියක් ලෙස කපු හා දැත්ත වගා කිරීමට අපේක්ෂිතයි.

**අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්**

- දේශියන් හා විදේශිකයන් සඳහා විවිධ මට්ටම් වලින් ප්‍රදර්ශන පැවැත්වීමට අපේක්ෂිතයි.

## 2.7. ප්‍රාථමික කර්මාන්ත අංශය

**ප්‍රගතිය/ජයග්‍රහණ**

- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය මෙම වර්ෂයේදී උපයාගෙන ඇති අපනයන ආදායම ඇමරිකන් ඩොලර් මිලියන 435.52 කි.
- ශ්‍රී ලංකාවේ නව මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව යටතේ නියාගම හා ඇහැලියගොඩ ප්‍රදේශවල නව මැණික් නිධි හඳුනා ගැනීම 75% ක් අවසන් කර ඇත.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ වෘත්තීය නිපුනතාවය ඉහළ නැංවීම සඳහා පවත්වන පාඨමාලා වලට සිසුන් 841 ක් බඳවා ගෙන ඇත
- රත්නපුර ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ මධ්‍යස්ථානය ඉදිකිරීමේ කටයුතු 89% ක් අවසන් කර ඇත.
- 2022 වර්ෂයේදී මාර්ගගත ක්‍රමය ඔස්සේ මැණික් හා ස්වර්ණාභරණ අපනයන 206 ක් සිදු කර ඇත.
- සුළු හා මධ්‍ය පරිමාණ ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් නගා සිටුවීමට වැඩසටහන් අනුව දිස්ත්‍රික්ක 11 ක තෝරාගත් ස්වර්ණාභරණ ශිල්පීන් සඳහා ස්වර්ණාභරණ කට්ටල් 47 ක් ලබා දී ඇත.
- මැණික්මය ගුණාංග අඩු ඛණිජ සඳහා අගය ඉහල නැංවීමට නව තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වා දීම.
- ශ්‍රී ලංකාවේ ස්වර්ණාභරණ නිෂ්පාදන ශිල්පීන් රසදියට නිරාවරණය පිළිබඳ අධ්‍යනය හා අපද්‍රව්‍ය වලින් රත්‍රං වෙන්කර ගැනීම සඳහා විකල්ප ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත.
- මැණික් පතල් කර්මාන්තයේදී භූමි ප්‍රතිස්ථාපනය සඳහා තාක්ෂණික මාර්ගෝපදේශ සැකසීමේ ව්‍යාපෘතියට මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර ඇත.

**අභියෝග**

- මැණික් සඳහා ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වෙළඳ කේන්ද්‍රස්ථානයක් බවට පත් වී නොතිබීම.
- මැණික් සම්පත පරිපූර්ණ ලෙස තිරසර ලෙස භාවිතය සඳහා ගැනීමට නොහැකි වීම.
- විදේශ විනිමය නීත්‍යානුකූල ක්‍රමවේදයකට රට තුලට ගලා නොඒම.
- මැණික් සම්පත තිරසර භාවිතය සඳහා ජාතික ප්‍රතිපත්තියක් නොමැති වීම.
- මැණික් කැපීම හා ඔපදැමීමේ නිපුණතාවයෙන් යුත් ශ්‍රම බලකායක් නොමැතිවීම.
- කර්මාන්තයට නවීන තාක්ෂණය මුසු වීම මන්දගාමී ස්වරූපයකින් පැවතීම සහ කර්මාන්තකරුවා නවීකරණය වීමට ඇති අකැමැත්ත හේතුවෙන් ජාත්‍යන්තර වෙළඳපලට සරිලන ගුණාත්මක භාණ්ඩ නිෂ්පාදනය සීමා වීම.

- පුහුණුලාභීන්ගේ දැනුම හා ශිල්පීය නිපුණතාවයට ගැළපෙන පරිදි වැටුප් හා අනෙකුත් දීමනා ගෙවීමේ ක්‍රමවේදයක් කර්මාන්තය තුළ නොමැති වීම හේතුවෙන් කර්මාන්තය සඳහා යොමු වන පුහුණුලාභීන්ට එය සෘණ බලපෑමක් එල්ල කිරීම.

- කර්මාන්තයේ සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා ආයෝජකයන් සීමා වීම කර්මාන්තයේ සංවර්ධනයට බලපෑම.

- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය හා සම්බන්ධව කටයුතු කරන අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන වෙතින් ලැබෙන සහයෝගය අඩුවීම.

**ඉදිරි සැලසුම්**

- 2023 වර්ෂයේදී අපනයන ආදායම් ඇ.ඩො. බිලියනය දක්වා වැඩි කර ගැනීමට අපේක්ෂිතයි.
- ජාත්‍යන්තර මට්ටටම් මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනයක් ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට අපේක්ෂිතයි.
- කපා ඔපදමන ලද හා රළු මැණික් වෙන්දේසි පැවැත්වීමට කටයුතු කිරීමට නියමිතයි.
- රත්නපුර ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ මධ්‍යස්ථානය කර්මාන්තකරුවන් වෙත පැවරීමට අපේක්ෂිතයි.
- ශ්‍රී ලංකාවේ නව මැණික් නිධි ගවේෂණය හා තක්සේරු කිරීමේ ඒකාබද්ධ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
- ශ්‍රී ලංකාව කලාපීය මැණික් මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සඳහා ලංකාවේ හමු නොවන මැණික් වර්ගද සමඟින් මැණික් සංචිතය ඉහළ නැංවීමට කටයුතු කිරීමට අපේක්ෂිතයි.
- මැණික් තාපකරණය, අගය වැඩි කිරිම හා රසායනාගාර පහසුකම් ආශ්‍රිත පර්යේෂණ සිදු කිරීම සඳහා පසුබිම සකස් කිරීම
- ව්‍යවසායකයින් බිහි කිරීම සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම.
- මෙම ක්ෂේත්‍රයේ ප්‍රවණතාවයන්ට සරිලන පරිදි වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා නව පුහුණු මධ්‍යස්ථාන ස්ථාපනය කිරීමට අපේක්ෂිතයි.
- වටිනාකම අඩු කුඩා ප්‍රමාණයේ මැණික් ශ්‍රී ලංකාව තුළ කපා ඔපදැමීමේ තාක්ෂණය ඇතුළත් පුහුණු ඒකකයක් ස්ථාපනය කිරීම.
- ක්ෂේත්‍රයේ නිරත පුද්ගලික හා රාජ්‍ය ආයතන සමග විධිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රනයක් ඇති කිරීම.
- ක්ෂේත්‍රයේ නිරත කර්මාන්තකරුවන් පිළිබඳව සමීක්ෂණයක් සිදු කිරීම.
- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයන්හි අණ පනත් හා ගැසට්, කාලීන අවශ්‍යතාවය පරිදි සංශෝධනය කිරීම.
- මැණික් අපනයනය සඳහා නව වෙළඳපොළවල් හඳුනාගැනීම හා එම වෙළඳපොළවල් සමග ගිවිසුම් ගතවීම.
- කර්මාන්තය නියාමනය හා සංවර්ධනය කිරිම සඳහා සුදුසු සංශෝධන සිදු කිරීම.
- ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය හා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය ඒකාබද්ධ කිරීමට පියවර ගැනීම.

## 2.8. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශය

**ප්‍රගතිය/ජයග්‍රහණ**

- ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වගාකිරිමේ වැඩසටහන යටතේ අක්කර 94 ක අමුද්‍රව්‍ය වගා කිරීම සිදු කර ඇත.

- ජාතික අමුද්‍රව්‍ය බැංකුව ස්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ අමුද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන වන වරාගොඩ සෙරමික් පුහුණු මධ්‍යස්ථානය, බිබිල නන්නපුරාව වේවැල් පුහුණු මධ්‍යස්ථානය සහ මහනුවර පොල්ගොල්ල අමුද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයෙහි සංවර්ධන කටයුතු සිදු කර ඇති අතර ශිල්පීන් 100 ක් සඳහා අමුද්‍රව්‍ය පහසුකම් සපයා ඇත.

- ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත ගම්මාන ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන යටතේ 2021 වසරේ සංවර්ධනය කළ ගම්මාන 21 ක නව මෝස්තර, නව තාක්ෂණය සම්බන්ධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර එමගින් ශිල්පීන් 640 ක් සඳහා ප්‍රතිලාභ සලසා දී ඇත.

- ග්‍රාමීය කර්මාන්ත සඳහා දේශිය හා විදේශිය වෙළඳපොල ප්‍රවර්ධන වැඩසටහන යටතේ දේශීය අළෙවි අවස්ථා 335 ක් හා විදේශීය අළෙවි අවස්ථා 2 ක් උදා කර දී ඇත. මෙමඟින් කර්මාන්තකරුවන් 5344 ක් සඳහා අළෙවි පහසුකම් සලසා ඇත.

- එක් ගමකට එක් ව්‍යවසායකයෙක් බිහිකිරීම තුළින් හඳුනාගත් ව්‍යවසායකයින් අතුරින් තෝරාගත් සාර්ථක ග්‍රාමීය කර්මාන්තකරුවන් දේශිය සුපිරි වෙළඳසැල් ජාලය හා විදේශ වෙළඳපොල සඳහා භාණ්ඩ සපයන සඵලදායි කර්මාන්තකරුවන් ලෙස බලගැන්වීමේ වැඩසටහන යටතේ තෝරාගත් ව්‍යවසායකයින් 1480 ක් අතරින් කර්මාන්තකරුවන්/ නිෂ්පාදන 747 ක් කාර්මික තාක්ෂණ ආයතනය (ITI) වෙත හා කර්මාන්තකරුවන්/ නිෂ්පාදන 771 ක් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) වෙත යොමු කිරීම සිදු කර ඇත. ඒ අතරින් කර්මාන්තකරුවන් 06 ක් සඳහා GMP සහතික නිකුත් කර ඇත.

**අභියෝග**

- ව්‍යාපෘති සිදුකරගෙන යාමේ දී එයට අදාළ අත්මුදල් නියමිත කාලය තුළ ලබා ගැනීමේ අපහසුතා ඇති වීම.

- වෙනත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය තුළින් සිදුකරනු ලබන වැඩසටහන් කරගෙනයාමේ දී ආයතන අතර මනා සම්බන්ධීකරණයක් නොපැවතීම නිසා සංකීර්ණතාවන් හා ප්‍රමාදයන් සිදුවීම.

- රටේ පවතින ආර්ථික අස්ථායිතාව හා ආනයන සීමා කිරීම හමුවේ දේශීය වෙළඳපොළ තුළ භාණ්ඩ හිඟවීම හා මිල උච්චාවචනය වීම.

**ඉදිරි සැලසුම්**

- ග්‍රාමීය හා සාම්ප්‍රදායික හස්ත කර්මාන්තකරුවන්ගේ උපයෝජනය සඳහා රජයට අයත් ඌන උපයෝජිත ඉඩම් හා පෞද්ගලික අංශයට අයත් ඉඩම් අක්කර 50ක අමුද්‍රව්‍ය ශාක වගා කිරීම.

- ග්‍රාමීය හා සාම්ප්‍රදායික හස්ත කර්මාන්තකරුවන්ගේ අමුද්‍රව්‍ය අවශ්‍යතාව සපුරාලීම සඳහා අමුද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන 07 ක් නවීකරණය කිරීම හා එමඟින් කර්මාන්තකරුවන් 500 කට අමුද්‍රව්‍ය පහසුකම් සැපයීම.

- දේශීය නිෂ්පාදන සඳහා විදේශීය වෙළඳපළ ආකර්ෂණ කරගත හැකිවන පරිද්දෙන් ගුණාත්මකභාවයෙන් යුත්, නව මෝස්තර ඇතුළත් නිෂ්පාදන 100 ක් හඳුන්වා දීම.

- ග්‍රාමීය කර්මාන්තකරුවන් සඳහා දේශීය, විදේශීය අළෙවි අවස්ථා උදාකර දීම තුළින් කර්මාන්තකරුවන් 900 ක් සඳහා පහසුකම් සැලසීම.

- දැව නිෂ්පාදන ආශ්‍රිත මෝස්තර හා නිර්මාණ නවෝත්පාදන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම මඟින් දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ නියැලීමට කැමති ආධුනිකයන් 100 ක් සඳහා පුහුණු අවස්ථා සලසා දීම හා දැනටමත් දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ නියැලන ශිල්පීන් සඳහා පහසුකම් සලසා දීම.

- ලෝකුරු කර්මාන්තයේ නිරත ශිල්පීන් සඳහා නව තාක්ෂණය, නව මෝස්තර සහ පුහුණු අවස්ථා උදාකර දීම.

## 2.9. ජාතික ලුණු සමාගම

**ප්‍රගතිය/ජයග්‍රහණ**

- මන්නාරම හා අලිමංකඩ ලුණු ලේවායන් නිෂ්පාදනය කටයුතු සිදු කිරිම

**ඉදිරි සැලසුම්**

- අලි මංකඩ ලුණු ලේවායෙහි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 25000ක් දක්වා ඉහල නංවා ගැනීමට අපේක්ෂිතයි.

- අලි මංකඩ ලුණු ලේවායෙහි මේස ලුණු නිෂ්පාදන යන්ත්‍රාගාරය ස්ථාපිත කිරීම.

- මන්නාරම ලුණු ලේවායෙහි මේස ලුණු නිෂ්පාදන යන්ත්‍රාගාරයෙහි දිගුවක් ආරම්භ කිරීම.

- කුරුන්වතිවු ලුණු ලේවායෙහි මෙහෙයුම් කටයුතු සී / ස ජාතික ලුණු සමාගම විසින් සිදු කිරීම.

# 2.10. රාජ්‍ය ව්‍යවසායන්

## 2.10.1. කාර්මික සංවර්ධන මණ්ඩලය

**ප්‍රගතිය/ජයග්‍රහණ**

- ඒකල කර්මාන්තපුරයේ කර්මාන්තවල බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ නියමු වැඩසටහනට විදේශ තාක්ෂණික හවුල්කරුවෙකු (USAID) සම්බන්ධ වීම.
- පශ්චාත් ඉංජිනේරු තාක්ෂණය භාවිතා කරමින් විදුලි මෝටර් රථයක මූලාකෘති නිෂ්පාදනය සඳහා ගිවිසුමක් අත්සන් කිරීම
- 2022/2023 ජා-ඇල, ඒකල IDB කර්මාන්තපුරයේ නිෂ්පාදන කර්මාන්තවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- IDB සහ Mahindra Ideal Lanka Pvt. Ltd. අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම
- "Get up - Start Up for a Wealthy Nation" ජාතික වැඩසටහන ආරම්භ කිරීම.
    - ව්‍යවසායකයන් හා ආයෝජකයන් සඳහා නව වේදිකාවක් තාක්ෂණිකව නිර්මාණය කිරීමට ජංගම යෙදවුමක් ( IDB Mobile APP) හඳුන්වාදීම
    - කර්මාන්ත තොරතුරු වෙනුවෙන් 1995 නමින් හදිසි ඇමතුම් අංකයක් හා 0705001995 ලෙසින් වට්ස්ඇප් අංකයක් හඳුන්වා දීම
    - Business Clinic හඳුන්වා දීම
    - School Entrepreneurial Circle සහ Investor Pool ආරම්භ කිරීම
    - ව්‍යවසායකයන් සඳහා අඩු පොලී යටතේ ණය පහසුකම් ලබාදීම වෙනුවෙන් HDFC බැංකුව සමග අවබෝධතා ගිවිසුමකට එළඹීම
    - ත්‍රී වීල් රථ රියදුරන් ව්‍යවසායකයන් බවට පත් කිරීම සඳහා ඔවුන්ට තාක්ෂණික දැනුම ලබාදීමේ
    - ඩිජිටල් බැංකු තාක්ෂණය හඳුන්වාදීම ආදී සුවිශේෂී කාර්යන් රාශියක් සිදු කරයි.

- කාර්මික ජනපදවල යටිතල පහසුකම් නැවත සක්‍රිය කිරීම සහ නවීකරණය කිරීම
- නව කර්මාන්ත 164 ක් ඇති කිරීමට සහ පවතින කර්මාන්ත 460 ක් දියුණු කිරීමට සහාය වීම
- තාක්ෂණ පුහුණු වැඩසටහන් 403ක් සහ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 14 ක් පැවැත්වීම
- ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 14 ක් පැවැත්වීම
- අමුද්‍රව්‍ය ලෙස ලෝහ ආශ්‍රිත කර්මාන්ත සඳහා ලෝහ අවශේෂ මෙට්‍රික් ටොන් 1392ක් සැපයීම
- රබර් නිෂ්පාදන කර්මාන්ත සඳහා රබර් සංයෝග සැපයීම
- ආහාර රසායනාගාරය මගින් ව්‍යවසායකයින් 314 ක් ආහාර පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම
- යන්ත්‍රෝපකරණ සැකසීම, තක්සේරු වාර්තා, CNC පහසුකම් ආදිය සඳහා ඉංජිනේරු සේවා සැපයීම.

**ඉදිරි සැලසුම්**

- ජා-ඇල, ඒකල IDB කර්මාන්තපුරයේ නිෂ්පාදන කර්මාන්තවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිතයි.
- පාරිසරික වෙනස්වීම් සඳහා ශ්‍රී ලංකාවේ කර්මාන්ත දක්වන ප්‍රතිචාරය වේගවත් කිරීමට නියමිතයි.
- ශ්‍රී ලංකාව තුළ පසු අස්වනු නෙලීමේ කටයුතු ඵලදායී ව ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.

## 2.10.2. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)

**ප්‍රගතිය/ජයග්‍රහණ**

- ශ්‍රී ලාංකීය ක්ෂුද්‍ර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගේ නිෂ්පාදන දේශීය හා විදේශීය ප්‍රවර්ධනය හා පහසුකම් සැපයීම සඳහා ස්ථාපිත Made in Sri Lanka වෙළඳ ද්වාරය යටතේ සැපයුම්කරුවන් 917 ක් ලියාපදිංචි කර ඇත.

- ක්ෂුද්‍ර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ දත්ත පද්ධතියට ව්‍යවසායක දත්ත 260,000 ක් ඇතුලත් කර ඇත.

- "Made in Sri Lanka" ලාංඡනය ප්‍රවර්ධනය කිරීම හා පිරිනැමීම.

- "Made in Sri Lanka" වෙළඳ සල්පිල් දෙකක් අලෙවි කුටි 160 ක් ව්‍යවසායකයින් 199 සහභාගීත්වයෙන් පවත්වා ඇත

- "Made in Sri Lanka" වරලත් වෙළඳ අලෙවිසැල් පිහිටුවීම

- උපාධිධාරී ව්‍යවසායක උදානය වැඩසටහන යටතේ උපාධිධාරීන ව්‍යවසායකයින් 7 දෙනකු බිහි කර ඇත.

- පර්ෂද සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

- ප්‍රාදේශීය ව්‍යවසාය සම්මාන ප්‍රදාන උත්සව බස්නාහිර,උතුරු මැද, සබරගමුව,දකුණ සහ මධ්‍යම යන පළාත්වල පැවැත්විය.

- ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යවසායකයින් 30023 කට පුහුණුව ලබා දීම හා නව ව්‍යවසායන් 957 ක් බිහිකර ඇත.

- ව්‍යවසායක සංසද ක්‍රියාත්මක කිරීම.

**අභියෝග**

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන කටයුතුවල නියැලී සිටින අනෙකුත් ආයතන නිරීක්ෂා කිරීමට සහ මඟ පෙන්වීමට නියාමන අධිකාරියක් නොමැති වීම.

**ඉදිරි සැලසුම්**

- ශ්‍රී ලංකාවේ MSME නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම සඳහා නිෂ්පාදන ප්‍රදර්ශනාගාරයක් පිහිටුවීමට අපේක්ෂිතයි.
- කොස් ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා ''ජැක් මාට්'' ස්ථාපිත කිරීම.
- උපාධිධාරී ව්‍යවසායකයින් ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල සහ රාජ්‍ය ආයතන සමඟ ජාලගත කිරීම.
- කැලණිය විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පෙරවැඩුම මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- "MSME ප්‍රවර්ධන සහ පහසුකම් කමිටුවක්" පිහිටුවීම.
- කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ විෂය පථය යටතේ සහ ප්‍රධාන රාජ්‍ය ආයතනවලින් සමන්විත අපනයන ප්‍රවර්ධන කාර්ය සාධක බලකාය/සංසදය පිහිටුවීම.

# පරිච්ඡේදය 03

## වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

ඒසීඒ- ඒඒ

# 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

| අයවැය 2022 රු. | | සටහන | තථ්‍ය 2022 | 2021 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 2,972,105,784.15 | 2,623,229,810.48 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 62,060,511.48 | 23,753,162.29 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | ,30,964,040.79 | 25,008,560.48 | ඒසීඒ-5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | 90,105,029.86 | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **3,155,235,366.28** | **2,671,991,533.25** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **3,155,235,366.28** | **2,671,991,533.25** | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ(ඈ) | | | 963,940.98 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 3,155,235,366.28 | 2,671,027,592.27 | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 588,641,200 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 505,522,276.67 | 378,958,652.28 | ඒසීඒ-2(ii) |
| 382,001,800 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 226,452,723.26 | 103,886,661.57 | |
| 969,990,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 891,352,572.14 | 509,394,781.22 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| 100,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| **1,940,733,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **1,623,327,572.07** | **992,240,095.07** | |
| | **මූලධන වියදම්** | | | | |
| 33,100,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 13,126,641.86 | 18,831,340.57 | ඒසීඒ -2 (ii) |
| 16,850,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 11,845,505.00 | 12,788,432.12 | |
| 262,840,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 178,974,831.10 | 142,454,677.91 | |
| 840,000,000 | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | 736,436,470.00 | 1,225,563,567.98 | |
| 2,567,000 | හැකියා වර්ධනය | 14 | 2,109,572.83 | 1,236,045.00 | |
| 1,191,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 761,538,120,75 | 833,991,911.69 | |
| **2,346,357,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **1,704,031,141.54** | **2,234,865,975.27** | |
| | **තැන්පතු ගෙවීම්** | | 68,789,609.26 | 25,241,896.35 | ඒසීඒ-4 |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 45,351,694.27 | 18,140,192.21 | ඒසීඒ-5 |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | 114,141,303.53 | 43,382,088.56 | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **3,441,500,017.14** | **3,270,488,158.90** | |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ= (ඉ-එ)** | | **(286,264,650.86)** | **(599,460,566.63)** | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | | **(286,264,650.86)** | **(605,465,298.13)** | ඒසීඒ-7 |
| | **2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | **6,004,731.50** | ඒසීඒ-3 |
| | | | **(286,264,650.86)** | **(599,460,566.63)** | |

# 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තත්‍ය 2022 රු. | 2021 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 2,121,746,885.46 | 1,703,475,097.33 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම | ඒසීඒ-5 | 70,721,316.76 | 56,333,663.28 |
| කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම | ඒසීඒ-5(ඒ) | 15,398,840.00 | |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | 6,004,731.50 |
| **මුළු වත්කම්** | | **2,207,867,042.22** | **1,765,813,492.11** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 9,019,543.13 | (9,591,766.36) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 2,121,746,885.46 | 1,703,475,097.33 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | 15,398,840.00 | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 61,701,773.63 | 65,925,429.64 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | 6,004,731.50 |
| **මුළු වගකීම්** | | **2,207,867,042.22** | **1,765,813,492.11** |

පිටු අංක...07...සිට ...76.. දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම පිටු අංක ..77... සිට ....82.. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
|---|---|---|
| නම : ජේ.එම්. තිලකා ජයසුන්දර | නම : ජේ.එම්. තිලකා ජයසුන්දර | නම : එස්.එච්. ප්‍රනාන්දු |
| තනතුර : ලේකම් කර්මාන්ත අමාත්‍යාංශය 73/1, ගාලු පාර, කොළඹ 03. | තනතුර : ලේකම් කර්මාන්ත අමාත්‍යාංශය 73/1, ගාලු පාර, කොළඹ 03. | ප්‍රධාන මූල්‍ය නිලධාරි කර්මාන්ත අමාත්‍යාංශය 73/1, ගාලු පාර, කොළඹ 03. |
| දිනය : 2023/02/[illegible] | දිනය : 2023/02/[illegible] | දිනය : 2023/02/[illegible] |

** 2022 [illegible] කිරීමේදී කර්මාන්ත අමාත්‍යාංශයට අනුබද්ධව පැවති රාජ්‍ය අමාත්‍යාංශ 03ක ගණුදෙනු ද ඇතුලත්ව ඇත.

2

ඒසීඒ-සී

# 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | තතය | |
|---|---|---|
| | 2022 | 2021 |
| | රු. | රු. |
| <u>**මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | - |
| මුළු බදු ලැබීම් | | |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | |
| ලාභ | | |
| ආදායම් නොවන ලැබීම් | | |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 35,910,463.21 | 33,420,559.22 |
| අග්‍රිම ලැබීම් | 2,063,733,470.00 | 2,623,229,810.48 |
| අත්තිකාරම් අයකර ගැනීම | 102,508,146.96 | 22,675,628.07 |
| තැන්පතු ලැබීම් | 32,390,224.35 | 23,753,162.29 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **2,234,542,304.52** | **2,703,079,160.06** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 729,940,223.80 | 482,665,123.85 |
| සහනාධාර සහ මාරුකිරීම් | 24,626,741.14 | 15,187,659.22 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 30,824,478.72 | (410,372.23) |
| අතුරු අග්‍රිම නිරවුල් කිරීම (පැවති බතික් රජ්‍ය අමාත්‍යාංශය) | (125,000.00) | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | 963,940.98 |
| අත්තිකාරම් ගෙවීම් | 102,363,614.09 | 19,507,893.39 |
| තැන්පතු ගෙවීම් | 39,240,044.52 | 19,529,567.35 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **926,870,102.27** | **537,443,812.56** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **1,307,672,202.25** | **2,165,635,347.50** |
| <u>**ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| පොළී | | |
| ලාභාංශ | | |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | |
| උපණය අයකර ගැනීම් | | |
| අත්තිකාරම් අයකර ගැනීම | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | - | - |

| | | |
|---|---|---|
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 1,316,386,290.25 | 2,159,630,616.00 |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් - අනෙකුත් ශීර්ෂ | (8,714,088.00) | |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **1,307,672,202.25** | **2,159,630,616.00** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | **(1,307,672,202.35)** | **2,159,630,616.00** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඈ) + (ඊ)** | **-** | **6,004,731.50** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | | |
| විදේශීය ණය ගැනීම් | | |
| ප්‍රදානයන් ලැබීම් | | |
| තැන්පතු ලැබීම් | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | |
| තැන්පතු ගෙවීම් | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ)** | | **6,004,731.50** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | **6,004,731.50** |

ඒසීඒ -2

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

වියදම් ශීර්ෂ අංකය :149

අමාත්‍යාංශයේ නම : කර්මාන්ත අමාත්‍යාංශය

රු.

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වියදමෙහි නම | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරු කිරීම (3) | මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | මුළු වියදම (5) | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම) (6)=(4)-(5) |
|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන (1) | (1) පුනරාවර්තන | 642.250.000 | 7.000.000 | (4.317.000) | 644.933.000 | 425.262.845 | 219.670.155 |
| | (2) ප්‍රාග්ධන | 41.800.000 | 0 | 4.317,000 | 46,117.000 | 25.401.588 | 20,715.412 |
| | උප එකතුව | 684.050.000 | 7.000.000 | 0 | 691.050.000 | 450.664,432 | 240.385.568 |
| වැඩසටහන (2) | (1) පුනරාවර්තන | 1.295.800.000 | 0 | 0 | 1.295.800.000 | 1.198.064.727 | 97.735.273 |
| | (2) ප්‍රාග්ධන | 2.268.400.000 | 31.840.000 | 0 | 2.300.240.000 | 1.678.629.554 | 621.610.446 |
| | උප එකතුව | 3.564.200.000 | 31.840.000 | 0 | 3.596.040.000 | 2.876.694.281 | 719.345.719 |
| | මුළු එකතුව | 4.248.250.000 | 38.840.000 | 0 | 4.287.090.000 | 3.327.358.713 | 959.731.287 |

...........................................

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/

අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)

දිනය : 2023. 02. 27

එස්.එච්. ප්‍රනාන්දු
ප්‍රධාන මූල්‍ය නිළධාරි
කර්මාන්ත අමාත්‍යාංශය
73/1, ගාලු පාර, කොළඹ 03.

# 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

## වාර්තා කිරීමේ පදනම

**1. වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**2. මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කල මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**3. ආදායම් හඳුනා ගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනියි.

**5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

**6. මුදල් හා මුදල් සමාන දෑ**

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය: අදාල නැත

රු.

| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| | | | | | |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය රු. | අවසාන ප්‍රතිපාදනය රු. | | |
| පුනරාවර්තන | 1,938,050,000 | 1,940,733,000 | 1,623,327,572 | 83.6% |
| ප්‍රාග්ධන | 2,310,200,000 | 2,346,357,000 | 1,704,031,142 | 72.6% |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන:

රු.

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 1 | රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 2022/01/03 දින පත්වීම ලද නවක සංවර්ධන නිලධාරීන්ට වැටුප් හා දීමනා ගෙවීම | 86,788,450 | 86,788,450 | 84,663,313 | 98% |
| 2 | අධ්‍යාපන අමාත්‍යාංශය | විද්‍යා මධ්‍යස්ථානය න්හි අවශ්‍ය වියදම් දැරීම සඳහා | 224,982,000 | 224,982,000 | 222,254,000 | 99% |
| 3 | වනජීවි දෙපාර්තමේන්තුව | බුල්ඩෝසර් මිලදී ගැනීම සඳහා | 30,000,000 | 30,000,000 | 8,040,000 | 27% |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | **31.12.2022** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | **31.12.2022** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණය ට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 74,200,000.00 | 74,200,000.00 | - | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 996,046,885.46 | 996,046,885.46 | - | 100% |
| 9153 | ඉඩම් | 1,051,500,000.00 | 1,051,500,000.00 | - | 100% |

## 3.9. විගණකාධිපති වාර්තාව

**ඇමුණුම් 1 ලෙස ඉදිරිපත් කර ඇත. (පිටු අංක** i - xiv **)**

# පරිච්ඡේදය 04

# කාර්ය සාධන දර්ශක

## 4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව

| | විශේෂිත දර්ශක | දත්ත පදනම (තත්‍ය අගය 2021) | අපේක්ෂිත අගය 2022 | තත්‍ය අගය 31.12.2022 | පුරෝකථනය | | | 2022 අපේක්ෂිත අගයේ ප්‍රතිශතයක් (%) ලෙස |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2023 | 2024 | 2025 | |
| 1 | වාණිජ නිෂ්පාදනයේ යෙදෙන මුළු කර්මාන්ත ගණන - සමුච්චිත | 723 | 787 | 733 | 795 | 845 | 900 | 93.14 |
| 2. | වාණිජ නිෂ්පාදනයේ යෙදෙන නව කර්මාන්ත ගණන | 72 | 65 | 33 | 43 | 40 | 40 | 50.77 |
| 3. | උත්පාදනය කරන ලද මුළු රැකියා ප්‍රමාණය - සමුච්චිත | 31,134 | 32,634 | 30,509 | 32,095 | 33,695 | 35,395 | 93.49 |
| 4 | උත්පාදනය කරන ලද නව රැකියා ප්‍රමාණය | 2,474 | 700 | 481 | 1,600 | 1,400 | 1,400 | 68.71 |
| 5 | නිෂ්පාදන කර්මාන්තයන්හි ගුණාත්මකභාවය ඉහල නැංවීමට සඳහා පහසුකම් සැපයූ කර්මාන්ත ගණන (තත්ත්ව සහතිකරණයට) | 215 | 1,532 | 1,713 | 702 | 585 | 310 | 111.81 |
| 6 | නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත සඳහා සපයන ලද පුහුණු අවස්ථා සංඛ්‍යාව (කුසලතා/ ධාරිතා / තාක්ෂණික) | 447 | 541 | 1,225 | 1,013 | 1,118 | 1,164 | 226.43 |
| 7 | මූල්‍ය පහසුකම් සපයන ලද කර්මාන්ත සහ ව්‍යවසායයන් සංඛ්‍යාව (ණය යෝජනා ක්‍රම මඟින්) -සමුච්චිත | 3,331 | 4,158 | 4,433 | 5,065 | 5,435 | 5,815 | 106.61 |
| 8 | නව මැණික් නිධි ගවේෂණය හා මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නව පර්යේෂණ (ප්‍රමාණය) | 9 | 11 | 9 | 13 | 19 | 19 | 81.82 |

# පරිච්ඡේදය 05

# තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1. හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

| ඉලක්කය / පරමාර්ථය | ඉලක්ක | කාර්ය සාධන දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම (2022) | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| **ඉලක්ක 9: කර්මාන්ත නවෝත්පාදනය හා යටිතල පහසුකම් –** ප්‍රත්‍යස්ථ වූ යටිතල පහසුකම් තැනීම, අන්තර්ග්‍රහණය හා තිරසර කාර්මිකකරණය ක් ප්‍රවර්ධනය, නවෝත්පාදනය ධෛර්යවත් කිරීම | 9.2 අන්තර්ග්‍රහණය හා තිරසර කාර්මිකකරණයක් ප්‍රවර්ධනය කිරීම හා කර්මාන්ත අංශය රැකියා ප්‍රමාණයට හා දළ ජාතික නිෂ්පාදනය දක්වන දායකත්වය 2030 වන විට අවම වශයෙන් 50% කින් වැඩි කිරීම. | 9.2.1 නිෂ්පාදන එකතු කළ වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයේ සහ ඒක පුද්ගල නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස | | | |
| | | • වාණිජ නිෂ්පාදනයේ යෙදෙන නව කර්මාන්ත ගණන | | 50.77 | |
| | | • තත්ත්ව වැඩිදියුණු කිරීම / තත්ත්ව සහතික කිරීම සඳහා සහාය වන නිෂ්පාදන කර්මාන්ත ගණන | | | 111.81 |
| | | 9.2.2 රැකියාව, වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව නිෂ්පාදන රැකියා මුළු රැකියා ප්‍රමාණයේ අනුපාතයක් ලෙස | | | |
| | | • රැකියාව, වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජනනය කරන ලද නව රැකියා අවස්ථා ගණන | | 68.71 | |

| ඉලක්කය / පරමාර්ථය | ඉලක්ක | කාර්ය සාධන දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම (2022) | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| | 9.3 විශේෂයෙන් දියුණු වන රටවල කුඩා පරිමාණයේ කර්මාන්ත හා ව්‍යාපාරවලට ලැබෙන මූල්‍ය පහසුකම් හා වෙළෙඳපොළ සඳහා ඇති ප්‍රවේශය සහ අවස්ථාවන් ඉහළ නැංවීමත් එම ව්‍යවසායන් වටිනාකම් දාමයන්ට සහ වෙළඳපොළ දාමයන්ට ඒකාබද්ධ කිරීම. | 9.3.2 ණය හෝ ණය රේඛාව සහිත ප්‍රවර්ධනය කරන ලද කුඩා පරිමාණ කර්මාන්තවල අනුපාතය | | | |
| | | • ණය යෝජනා ක්‍රම මගින් මූල්‍යමය ආධාර ලබන කර්මාන්ත / ව්‍යවසායන් ගණන | | | 106.61 |

## 5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනිමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ තොරතුරු ප්‍රතිශාත්මකව පරිච්ඡේද 5,1 හි ඉලක්ක 9.2 සහ 9.3 තුල දක්වා ඇත.

# පරිච්ඡේදය 06

## මානව සම්පත් පැතිකඩ

## 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/(අතිරික්ත) ** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 91 | 64 | 27 |
| තෘතියික | 12 | 3 | 9 |
| ද්විතියික | 1258 | 1282 | **24 |
| ප්‍රාථමික | 429 | 362 | 67 |

## 6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

- තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇත.මෙතෙක් පිළිතුරු ලැබී නොමැත.

- 2020 නව පත්වීම් ලබාගත් සංවර්ධන නිලධාරීන් අමාත්‍යාංශයට පත්වීම් ලැබීමත් සමඟ අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා නිලධාරීන් සේවය කරන බැවින්, මේ පිළිබඳව අලුතින් අනුමත කර ගැනීමට අවශ්‍ය නව කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. මෙතෙක් පිළිතුරක් නොමැත.

# 6.3. මානව සම්පත් සංවර්ධනය

## දේශීය පුහුණු වැඩසටහන් - 2022

| | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව (දින) | සමස්ථ ආයෝජනය (රු) | වැඩසටහනේ ස්වභාවය | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| 1 | කුකුළේ ගඟ බාහිර පුහුණු වැඩ සටහන | 172 | දින 01 | 87,084 | දේශීය | නායකත්ව කුසලතා හා පෞරුෂ වර්ධනය තුළින් ආයතනයේ කාර්ය මණ්ඩලයේ සුහදතාව වර්ධනය කර ගැනීම. |
| 2 | පශ්චාත් උපාධි | 1 | අවු 01 | 91,875 | දේශීය | සේවා අවශ්‍යතා සපුරා ගැනීම. |
| 3 | ක්‍රියාශීලී පරිසර මෙවලමක් සමඟ කර්මාන්ත හරිතකරණය | 45 | දින 01 | 7,000 | දේශීය | රාජ්‍ය ආයතනයක් තුළ හරිතකරණය භාවිතා කළ යුතු ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම. |
| 4 | විනය, කාර්යාල ක්‍රම හා ලිපිගොනුකරණය | 44 | දින 01 | 3,240 | දේශීය | රාජ්‍ය ආයතනයක් තුළ කාර්යාල සේවක සේවයේ නිලධරයන්ගේ භූමිකාව පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම. |
| | | 17 | පැය 04 (දේශන) | 1,500 | දේශීය | කාර්යාලීය ලිපිගොනුකරණය වඩාත් විධිමත් හා ඵලදායී ලෙස පවත්වාගෙන යමින් කාර්යාලීය කටයුතු පහසු කිරීම. |
| | | 34 | දින 01 | 10000 | දේශීය | |
| 5 | රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම | 1 | දින 01 | 5,000 | දේශීය | රජයේ අමාත්‍යංශ, දෙපාර්තමේන්තු හා අර්ධ රාජ්‍ය ආයතනවල සියලුම වැටුප් පිළිබඳව අවබෝධය වර්ධනය කිරීම. |
| | | 01 | දින 01 | 5,000 | දේශීය | |
| 6 | ඒඩ්ස් පිළිබඳ දැනුවත් කිරීම | 35 | දින 01 | 5,500 | දේශීය | රාජ්‍ය ආයතනයක නිලධාරීන්ගේ පෞද්ගලික ජීවිතය මෙන්ම ඒ තුළින් රාජ්‍ය නිලධාරියෙකුගේ චර්යාව සකසා ගත යුතු ආකාරය පිළිබඳ දැනුම ලබා ගැනීම. |

| | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව (දින) | සමස්ථ ආයෝජනය (රු) | වැඩසටහනේ ස්වභාවය | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| 7 | ආයතන සංග්‍රහයේ විධිවිධාන | 2 | දින 02 | 15,000 | දේශීය | රාජ්‍ය සේවයේ උන්නතිය වෙනුවෙන් රාජ්‍ය නිලධාරීන් විසින් තම රාජකාරීන් ඉටු කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳ දැනුම ලබා ගැනීම. |
| 8 | කාර්යාල කළමනාකරණ හා මුදල් | 5 | දින 02 | 50,000.00 | දේශීය | රාජ්‍ය ආයතනයක් තුළ කටයුතු ඉටු කිරීමේ දී කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ අවබෝධය ඉතා වැදගත් අතර ඒ සඳහා මනා දැනුමක් ලබා ගැනීමට. |
| 9 | කාර්යාල සටහන් ලිවීම හා රාජකාරී ලිපි ලිවීම | 1 | දින 01 | 5,000 | දේශීය | ආයතන සංග්‍රහයට අදාළ මූලික ක්‍රියාවලියන් හා රාජ්‍ය මුදල් පරිහරණය පිළිබඳ මූලික දැනුම වර්ධනයකර ගැනීම. |
| 10 | පෞද්ගලික ලිපිගොනුවක් ඵලදායි ලෙස භාවිත කරන ආකාරය. | 3 | දින 01 | 15,000 | දේශීය | කාර්යාල පරිසරය, ලිපි සැකැස්ම හා ලිපිගොනුකරණය, වාර්තා ලිවීම පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| | | 01 | දින 01 | 4,000 | දේශීය | |
| 11 | නිවාඩු භාර නිලධාරියාගේ කාර්ය භාරය | 2 | දින 01 | 10,000 | දේශීය | රාජ්‍ය නිලධාරීන්ගේ නිවාඩු සැකසීම පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීම. |
| 12 | පශ්චාත් උපාධි | 1 | අවු 01 | 218,675 | දේශීය | සේවා අවශ්‍යතා සපුරා ගැනීම |
| 13 | පශ්චාත් උපාධි | 1 | අවු 01 | 105,000 | දේශීය | සේවා අවශ්‍යතා සපුරා ගැනීම |
| 14 | පශ්චාත් උපාධි | 1 | අවු 01 | 135,000 | දේශීය | සේවා අවශ්‍යතා සපුරා ගැනීම |
| 15 | Knowledge Sharing වැඩසටහන | 35 | දින 01 | 4,800 | දේශීය | රාජ්‍ය නිලධාරීන්ගේ එදිනෙදා රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය දැනුම බෙදා ගැනීම |

| | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව (දින) | සමස්ථ ආයෝජනය (රු) | වැඩසටහනේ ස්වභාවය | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| 16 | ඉදිකිරීම් ක්ෂේත්‍රයේ මිල උච්ඡාවචනය පිළිබඳ වැඩසටහන | 1 | දින 01 | 4,000 | දේශීය | අමාත්‍යාංශය තුළ හා කර්මාන්තපුරවල ඉදි කිරීම් කාර්යයන සඳහා අවශ්‍ය වන බැවින් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ මිල උච්ඡාවචනය පිළිබඳ අවබෝධය. |
| 17 | රජයේ වාහන නඩත්තුව පිළිබඳ වැඩමුළුව | 01 | දින 01 | 5,000 | දේශන | රජය සතු වාහන උපරිම කාර්යක්ෂමතාවයෙන් හා අවම පිරිවැයෙන් යුතුව පරිහරණය කිරීම හා ජීවයේ ආරක්ෂාව තහවුරු කිරීම. |
| | | 03 | 2022.03.15 | 15,000 | දේශන | |
| 18 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 01 | දින 01 | 10,000 | දේශන | රාජ්‍ය ආයතනවල ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ කරනු ලබන වැඩ, සේවාවල ඵලදායිතාවය වර්ධනය |
| | | 02 | 2022.03.03 – 2022.05.26 | 50,000 | දේශන | |
| 19 | ඵලදායිතා සංකල්ප පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 01 | දින 05 (වැඩමුළුව) | 8,000 | දේශන | ආයතනය තුළ පවතින ද්‍රව්‍ය සම්පත් උපරිම කාර්යක්ෂමතයකින් යුතුව මනා කළමනාකාරීත්වයකින් කාර්යාල පරිශ්‍රය සකස්කර ගැනීම තුලින් සේවාවෙහි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම. |
| | | 20 | 2022.03. 08 එක් දින | 37,130 | දේශන හා සාකච්ඡා | |
| 20 | ගිණුම්කරණ කාර්යභාරය හා ප්‍රායෝගික භාවිතය | 01 | දින 02 | 10,000 | දේශන | රාජ්‍ය මූල්‍ය විෂයපථය හා නීතිමය ව්‍යුහය, ගිණුම්කරණ මූලධර්ම හා එහි ප්‍රයෝජන හා වාර්ෂික ගිණුම් පියවීම පිළිබඳ මූලික දැනුම ලබා දීම. |
| | | 20 | දින 01 | 215,091 | දේශන | නවක සංවර්ධන නිලධාරීන් සඳහා කාර්යාල කටයුතු සඳහා භාවිතා වන සියලු ගිණුම් කටයුතු පිළිබඳ දැනුම ලබා දීම. |
| 21 | කාර්යසාධන මැනීම සහ කාර්යසාධන කළමනාකරණය පිළිබඳ විධායක සහතිකපත්‍ර | 01 | දින 10 | 20,000 | දේශන | කාර්යසාධනය මැනීම සහ කාර්යසාධන කළමනාකරණය හඳුන්වාදීම හා මූලික කාර්යසාධන දර්ශක (KPI) පිළිබඳ අවබෝධය ලබා දීම. |

| | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව (දින) | සමස්ථ ආයෝජනය (රු) | වැඩසටහනේ ස්වභාවය | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| 22 | දැනුම කළමනාකරණය | 03 | 2022.01.28 එක් දින | 9,000 | දේශන හා සාකච්ඡා | *දැනුම කළමණාකරණය සංකල්ප ආයතනයේ ගැටළු විසඳාගනිමින් අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට මානව සම්පත් සතු දැනුම යොදාගැනීම. |
| 23 | ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා කාර්යාල කාර්ය සහයකයින් හා රියදුරන්ගේ වෘත්තීය සංවර්ධනය | 04 | 2022.02.23 එක් දින | 20,000 | දේශන හා සාකච්ඡා | *ආචාරශීලීව හැසිරිම සහ ධනාත්මක චින්තනක ,ගුණාත්මක වැඩ පරිසරයක් නිර්මාණය කිරීමට කාර්යාල කාර්ය සහයකයින් හා රියදුරන්ගෙන් ඉටුවිය යුතු කාර්යභාරය. |
| 24 | එකාබද්ධ රියදුරු සේවයේ නිළධාරීන් සඳහා වන පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා වන පුහුණු වැඩසටහන | 04 | 2022.12.22 එක් දින | 80,000 | දේශන හා සාකච්ඡා | *මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම.<br>*මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම. |
| 25 | SWOT, PESTEL, PESTEL, KPIs වැඩමුළුව | 30 | 2022.06.13 | 52,660 | දේශන හා සාකච්ඡා | *SWOT, PESTEL, KPIS පිළිබඳ දැනුමින් සන්නද්ධ කිරිම. |
| 26 | රාජ්‍ය මූල්‍ය රෙගුලාසි | 02 | දින 01 | 36,000 | දේශීය | රාජ්‍ය මූල්‍ය රෙගුලාසි පිළිබඳව |
| 27 | ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන | | දින 03 | 684,909 | දේශීය | විදාතා අංශයට අනුයුක්ත කාර්ය මණ්ඩල සඳහා ව්‍යවසායකත්වය පිළිබඳ පුහුණුව ලබා දීම. |
| 28 | වාහන ධාවනය කරන නිලධාරීන් සහ රියදුරන් සඳහා විශේෂ පුහුණු වැඩසටහන | 15 | දින 03 | 91,666 | දේශීය | ඩීසල් සහ පෙට්‍රල් වාහන එන්ජින් ක්‍රියාකාරීත්වය. |

## සෘජු විදේශ පුහුණු හා සංචාර - 2022

| | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | කාල සීමාව | | සමස්ථ ආයෝජනය දේශීය/ විදේශීය (රු) | වැඩසටහනේ ස්වභාවය | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| 1 | ඔස්ට්‍රේලියානු කෙටි කාලීන පුහුණු පාඨමාලාව - කොවිඩ් 19 පසු වෙළඳ ප්‍රවර්ධනය හා අලෙවිකරණය | 01 | 2022.09.29 | 2022.10.02 | අනියම් දීමනාව ඇ.ඩො. 800 | විදේශ | විදේශ පුහුණුවට අදාළව වාර්තාව ලබා දී ඇති අතර එහි එමගින් ලබා ගත් දැනුම පිළිබඳව සවිස්තරාත්මකව කරුණු ඉදිරිපත් කර ඇත. |
| 2 | 67th Diplomatic Charity Bazzar | 01 | 2022.12.07 | 2022.12.12 | - | විදේශ | විදේශ පුහුණුවට අදාළව වාර්තාව ලබා දී ඇති අතර එහි එමගින් ලබා ගත් දැනුම පිළිබඳව සවිස්තරාත්මකව කරුණු ඉදිරිපත් කර ඇත. |
| 3 | තායිලන්තයේ සියැම් නගර සංචාරය | 01 | - | - | - | විදේශ | විදේශ පුහුණුවට අදාළව වාර්තාව ලබා දී ඇති අතර එහි එමගින් ලබා ගත් දැනුම පිළිබඳව සවිස්තරාත්මකව කරුණු ඉදිරිපත් කර ඇත. |
| 4 | වෙළඳ ප්‍රවර්ධන හා අලෙවිකරණය පිළිබඳ ඔස්ට්‍රේලියානු ප්‍රදාන පුහුණු පාඨමාලාව | 01 | දින 22 | | 304,880 | විදේශීය | පශ්චාත් කොවිඩ් 19 තුළ වෙළඳ හා අලෙවි ප්‍රවර්ධනය සම්බන්ධව ධාරිතා සංවර්ධනය. |
| 5 | කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන | 01 | දින 11 | | 159,676 | විදේශීය | කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය, ව්‍යවසායකත්ව සංවර්ධන, නිර්මාණාත්මක කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ ධාරිතා සංවර්ධනය. |

## විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් විදේශ ශිෂ්‍යත්ව සහ සංචාර - 2022

| | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | කාල සීමාව | | සමස්ථ ආයෝජනය දේශීය/ විදේශීය (රු.) | වැඩසටහනේ ස්වභාවය | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| 1 | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා සයිබර් ආරක්ෂාව හා තොරතුරු ප්‍රතිවිපාක පිලිබඳ සම්මන්ත්‍රණය (මාර්ගගත ක්‍රමය) | 02 | 2022. 03.03 | 2022. 03.16 | - | විදේශ මාර්ගගත ක්‍රමය | විදේශ පුහුණුවට අදාළව වාර්තාව ලබා දී ඇති අතර එහි එමගින් ලබා ගත් දැනුම පිළිබඳව සවිස්තරාත්මකව කරුණු ඉදිරිපත් කර ඇත. |
| 2 | 2022 කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය සඳහා වන ධාරිතා සංවර්ධන වැඩසටහන | 02 | 2022. 09.19 | 2022. 09.30 | ඇ.ඩො. 440 | විදේශ | විදේශ පුහුණුවට අදාළව වාර්තාව ලබා දී ඇති අතර එහි එමගින් ලබා ගත් දැනුම පිළිබඳව සවිස්තරාත්මකව කරුණු ඉදිරිපත් කර ඇත. |
| 3 | ලෝක කාර්මික හා තාක්ෂණ පර්යේෂණ සංවිධානයේ මහ සභා රැස්වීමේ 26 වැනි ද්විවාර්ෂික රැස්වීම හා 2022 සමුළුව | 02 | 2022. 11.14 | 2022. 11.16 | - | විදේශ | විදේශ පුහුණුවට අදාළව වාර්තාව ලබා දී ඇති අතර එහි එමගින් ලබා ගත් දැනුම පිළිබඳව සවිස්තරාත්මකව කරුණු ඉදිරිපත් කර ඇත. |
| 4 | මූලික උසස් විශ්ලේෂණ ශිල්පීය ක්‍රම පිළිබඳ ඉන්දියානු පුහුණු වැඩසටහන | 01 | 2022. 11.28 | 2022. 12.09 | ඇ.ඩො .280 | විදේශ | විදේශ පුහුණුවට අදාළව වාර්තාව ලබා දී ඇති අතර එහි එමගින් ලබා ගත් දැනුම පිළිබඳව සවිස්තරාත්මකව කරුණු ඉදිරිපත් කර ඇත. |

# පරිච්ඡේදය 07

## අනුකූලතා වාර්තාව

## අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | - | - |
| 1.6 | වෙනත් | අදාල නොවේ | - | - |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේක 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මූ.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්කාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | - | - |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | - | - |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම. | රැස්වීම් 4ක් පවත්වා තිබේ. අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **8.** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම. | අනුකූල වේ | - | - |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම. | අනුකූල වේ | - | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ. ඉන්ධන හිඟය නිසා සිදු කිරීමට නොහැකි විය. | - | - |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | - | - |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අදාල නොවේ. | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | - | - |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | - | - |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | - | - |
| **15** | **ආදායම් ගිණුම** | අදාල නොවේ | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | - | - | - |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | - | - | - |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | - | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **16** | මානව සම්පත් කළමනාකරණය | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | - | - |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **17** | මහජනයා වෙත තොරතුරු ලබා දීම | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | - | - |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **18** | පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ. | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | - | - |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | - | - |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | - | - |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | - | - |

# Annexture

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. IMT/E/MOI/ FS /2022/08

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 31 දින

කර්මාන්ත අමාත්‍යාංශය
06 JUN 2023
මුදල් අංශය

කර්මාන්ත අමාත්‍යාංශය
06 JUN 2023
1757
ලේකම් අංශය

ලේකම්,

කර්මාන්ත අමාත්‍යාංශය

කර්මාන්ත අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

යථෝක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (සිංහල,දෙමළ,ඉංග්‍රීසි) මේ සමඟ එවා ඇත.

යූ.එන් අලුත්ගේ

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත : අධ්‍යක්ෂ ජනරාල් ,රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

CFO

06/06

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } IMT/E/MOI/FA/2022/08 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 31 දින

ලේකම්,

කර්මාන්ත අමාත්‍යාංශය

**කර්මාන්ත අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කර්මාන්ත අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කර්මාන්ත අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු 1.6.1.1 (ඇ) , (ඉ) , (ඊ) සහ (උ) නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ආදායම් නොවන ලැබීම්

(අ) 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 හි 3.1 ඡේදය අනුව CIGAS යොමුව මගින් උත්පාදනය කරන ලද ශේෂ පිරික්සුම කිසිදු වෙනස් කිරීමකින් තොරව භාවිතා කර මූල්‍ය ප්‍රකාශන පිලියෙල කල යුතු බව දක්වා ඇත. ඒ අනුව අමාත්‍යාංශයේ CIGAS යෙදුම මගින් ලබාගත් ශේෂ පිරික්සුම අනුව

භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු.2,063,733,470 ක් වුවද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ එය රු.2,972,105,784 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු.908,372,314ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 හි 7.3 ඡේදය අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි අනෙකුත් ප්‍රධාන ලෙජරවල ලැබීම් හා ගෙවීම් සටහන් කල යුත්තේ අදාල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පමණක් වුවද වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් ලෙස රු.90,105,029 ක් දක්වා තිබීම හේතුවෙන් ආදායම් නොවන ලැබීම් රු.90,105,029 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(අ) CIGAS යෙදුම මගින් ලබාගත් ශේෂ පිරික්සුම අනුව රාජ්‍ය අමාත්‍යාංශවල වියදම් අධිභාර ලෙස දක්වා තිබුණද රු.591,034,918 ක් වූ අධිභාර, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයට ඇතුලත් කර නොතිබුණි.

(ආ) වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් රු.613,145,309 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.30,824,479 ක් ලෙස දැක්වීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය රු.582,320,830 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම අනෙකුත් ශීර්ෂ ලෙස රු.8,714,088 ක සෘණ අගයක් ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහයන් යටතේ මුදල් ප්‍රවාහය ප්‍රකාශයට ඇතුලත් කර තිබුණි.

### 1.6.3 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

(අ) අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් දරන ලද වියදම් රු.613,145,309 ක් වුවද අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ එය රු.30,824,479 ලෙස දැක්වීම හේතුවෙන් අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් දරන ලද වියදම් රු.582,320,830 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 2022/05 හි 7.10 ඡේදය අනුව අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට ඇතුලත් නොකල යුතු 149 ශීර්ෂය යටතේ පැවති අනෙකුත් රාජ්‍ය අමාත්‍යාංශ වෙත භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු. 908,372,314 ක් හා භාණ්ඩාගාර අග්‍රිම හැර වෙනත් මූලාශ්‍ර වලින් අග්‍රිම ලැබීම් රු. 90,105,030

ඇතුලත් කිරීම හේතුවෙන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ රු.998,477,344 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) ඉහත කරුණු නිවැරදි කිරීමෙන් පසු අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ එකතු කිරීමේ අගය රු.707,798,144 ක් විය යුතු වුවද එය රු.1,123,954,657 ක් ලෙස දක්වා තිබුණි.

(ඈ) වැසුණු රාජ්‍ය අමාත්‍යාංශ තුනට අදාල වියදම් අධිහාර වශයෙන් වූ රු.591,034,918 ක් අධිහාර ලෙස අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අඩු කිරීම් යටතේ දැක්විය යුතු වුවද එම වටිනාකම දක්වා නොතිබුණි.

(ඉ) භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා ආයෝජන අත්කර ගැනීම් අනෙකුත් ශීර්ෂ ලෙස රු.8,714,088 ක් හා බතික් රාජ්‍ය අමාත්‍යාංශයේ වියදම් මගින් පියවන ලද අතුරු අග්‍රිමය ලෙස රු.125,000 ක් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ඊ) ඒ අනුව අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අඩු කිරීම් අගය රු.1,992,415,139 ක් වුවද එය රු1,410,219,308 ලෙස දක්වා තිබුණි.

(උ) ඉහත ගැලපීම් හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂයරු.1,284,616,995 ක ඍණ අගයක් වුවද එය රු286,264,651 ක ඍණ අගයක් ලෙස දක්වා තිබුණි.

1.6.4 මූල්‍ය නොවන වත්කම්

(අ) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය (ACA6 ආකෘතියේ) අනුව ප්‍රවාහන උපකරණ සහ අනෙකුත් යන්ත්‍ර හා උපකරණවල වටිනාකම පිළිවෙලින් රු.483,123,759 ක් හා රු.94,651,338 ක් වූ අතර 2022 ජනවාරි 01 දිනට ඒවායේ ආරම්භක ශේෂ වටිනාකම පිළිවෙලින් රු.820,215,340 ක් හා රු.244,512,882 ක් වූයෙන් රු.486,953,125 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ACA6 අකෘතියේ ඇතුලත් අපහරන ලෙස දක්වා ඇති රු.80,430,000 ක් වූ ප්‍රවාහන උපකරණ හා රු. 1,648,500ක් වූ අනෙකුත් යන්ත්‍ර හා උපකරණ වටිනාකම හා ආරම්භක ශේෂයට එකතු කිරීම් ලෙස දක්වා ඇති රු.407,702 ක් වූ අනෙකුත් යන්ත්‍ර හා උපකරණ වටිනාකම සහ මාරුකිරීම් ලෙස දක්වා ඇති රු.1,084,688ක් වූ අනෙකුත් යන්ත්‍ර හා උපකරණ සම්බන්ධ වටිනාකම්

ගිණුම්කරණ දෝෂයන් වන නමුත් ඒවා මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට හෝ අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු ACA 6 ආකෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මගී වාහන වටිනාකම රු.703,322,021 ක් වුවද ගිණුම් අංශය මගින් ඉදිරිපත් කල වාහන සම්බන්ධ ලේඛනයේ එම වටිනාකම රු.743,887,021 වුයෙන් වෙනස රු.40,565,000 ක් විය.

(ඈ) 2022 දෙසැම්බර් 31 දින වන විට අපහරණය කර තිබුණු රු.3,025,000ක් වන වාහන 02 ක වටිනාකම ගිණුම් අංශය මගින් ඉදිරිපත් කළ වාහන ලේඛනයේ ඇතුලත්ව තිබුණි.

(ඉ) මුදල් අමාත්‍යාංශය හා දකුණු පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය වෙත පවරා තිබුණු රු.13,200,000 වටිනා වාහන 02 ක් කර්මාන්ත අමාත්‍යාංශයේ වත්කම් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

(ඊ) විවිධ අමාත්‍යාංශවලින් රු.4,800,000 ක වටිනාකමැති වාහන 03 ක් කර්මාන්ත අමාත්‍යාංශය වෙත ලැබී තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විට එම වාහන ලියාපදිංචි අමාත්‍යාංශ අහෝසි කර තිබුණි. එම වාහන අමාත්‍යාංශය විසින් භාවිතා කලද එහි වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි.

(උ) අමාත්‍යාංශය විසින් වියදම් දරා ඉදිකරන ලද ගොඩනැගිලි වටිනාකම එහි මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කල යුතු වුවත් කර්මාන්ත සංවර්ධන අංශයෙන් ලද තොරතුරුවලට අනුව 1996 වර්ෂයේ සිට කර්මාන්තපුර 16 ක ඉදිකල පරිපාලන ගොඩනැගිලි 13 ක, කර්මාන්තශාලා 03 ක හා කාර්යාල නිවාස/සේවා ගොඩනැගිලි 02 ක වටිනාකම වූ රු.මිලියන 456.98 ක් 2022 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත කර නොතිබුණි.

### 1.6.5 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම

මියගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.198,397 ක් වූ ණය ශේෂයද , වැඩ තහනමට ලක් වූ එක් නිලධාරියෙකුගෙන් අය විය යුතු රු.100,208 ක් වූ ණය ශේෂයද, සේවය හැර ගිය නිලධාරින් තිදෙනෙකුගෙන් අය විය යුතු රු.273,029 ක් වූ ණය ශේෂයන්ද වශයෙන් එකතුව රු.571,634ක් වර්ෂ 1 සිට 5 දක්වා කාලයක සිට අය නොවී පැවතුණි.

1.6.6 තැන්පත් ගිණුම් ශේෂ

(අ) 2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය සතු තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවා ගන්නා තැන්පතු ගිණුමේ ශේෂය රු.20,279,073 විය.

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය සතු කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් තැන්පතු ගිණුමේ ශේෂය රු.38,291,283 ක් විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) වැය විෂයයන් 66 කට අදාලව සලසන ලද රු. 471,095,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.115,891,080 උපයෝජනය කර රු.355,203,920 ක ඉතිරියක් පැවතුණ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 51 ත් සියයට 99 ත් අතර පරාසයක් ගෙන තිබුණි.

(ආ) වැය විෂයය 18 කට අදාලව සලසන ලද රු.100,650,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම වියදම් කිරීමකින් තොරව ඉතිරි වී තිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2023 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි ගෙවීම් වවුචර පරීක්ෂාවේදී වැය විෂයයන් 14 කට අදාලව රු.2,726,134 ක් වූ ගෙවීම 2022 වර්ෂයට අදාලව සිදුකර තිබුණු බව නිරීක්ෂණය වූ අතර එම වටිනාකම බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (අ) | මුදල් රෙගුලාසි 570 (ආ), (ඇ) | රු.29,941,927 ක් වටිනා තැන්පතු 53 ක් වසර 02 කට වැඩි කාලයක සිට පවතී. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනැති කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ ශ්‍රී | රජය සතු සෑම වාහනයක් සඳහාම වර්ෂ 5කට වරක් තක්සේරුවක් ලබා ගැනීම අනිවාර්ය වන අතර එම |

| | |
|---|---|
| ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශයේ 1.3.1 වගන්තිය | තක්සේරු වටිනාකම ගිණුම්කරණ කටයුතු සඳහා පමණක් යොදා ගත යුතු බව සඳහන් වුවද අමාත්‍යාංශය සතු රුපියල් මිලියන 438.42 ක වටිනාකමකින් යුත් වාහන 65ක් සම්බන්ධයෙන් එලෙස තක්සේරු කටයුතු සිදු කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

රයිගම හරිත කාර්මික හා තාක්ෂණික සංවර්ධන සුපිරි කර්මාන්ත කලාපයක් ස්ථාපිත කිරීම සඳහා එහි ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු. මිලියන 97.27 ක මුදලක් 2022 වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුවෙන් වෙන් කර තිබුණු අතර ඒ සඳහා රු.48,182,982 ක වියදම් දරා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එහි ඉදිකිරීම් කටයුතු නිම කළ යුතු වුවද මූල්‍ය ප්‍රගතිය සියයට 49 ක් හා අපේක්ෂිත භෞතික ප්‍රගතිය අත්කර ගැනීමට නොහැකි වී තිබුණි.

#### 3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) 2022 දෙසැම්බර් 31 වන විට කර්මාන්තපුර 15 කට අදාලව ඉඩම් කට්ටි 66 ක් කර්මාන්තකරුවන් වෙත වෙන් කර ලබා නොදීම හේතුවෙන් එම ඉඩම් නිශ්කාර්යව පැවතුණි.

(ආ) බුත්තල කර්මාන්තපුරයේ ඉඩම් කට්ටි 43 ක් වෙන් කර තිබුණු අතර ඉන් ඉඩම් කට්ටි 41 ක් කර්මාන්තකරුවන් 17 කට ලබා දී තිබුණි. ඉන් නිෂ්පාදන කටයුතු සිදු කරනු ලබන්නේ කර්මාන්තකරුවන් 5 ක් වන අතර කර්මාන්තකරුවන් 7 ක් ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවති. කර්මාන්තකරුවන් තිදෙනෙකු වෙත වෙන් කර දී තිබුණ පර්චස් 340.8ක් වූ මුලු ඉඩම් ප්‍රමාණයම වර්ෂ 13 කට ආසන්න කාලයක් නිශ්කාර්යව පැවතුණි.

(ඇ) ආහාර නිෂ්පාදකයින් වෙළඳුන් සහ අපනයනකරුවන් සඳහා කාබනික සහතිකකරණයට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාදීමේ ව්‍යාපෘතියක් කාර්මික සංවර්ධන මණ්ඩලය හා එක්ව අමාත්‍යාංශය විසින් 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබූ අතර කාබනික සහතිකකරණය වෙනුවෙන් කර්මාන්තකරුවන් 25 දෙනෙකුට රු.250,000 බැගින් ලබා දීමට හා අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා රු.මිලියන 6.85 ක් අමාත්‍යාංශය

විසින් ඇස්තමේන්තු කර තිබුණි.මෙම ව්‍යාපෘතියේ කාලය අවසන් වුවද තවත් කර්මාන්තකරුවන් 6 දෙනකු සහතික කරණ ක්‍රියාවලිය අවසන් කර සහතික ඉදිරිපත් කර නොතිබුණි.

### 3.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

2007 ඔක්තෝබර් 10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මතුගම කර්මාන්තපුරයෙන් සෘජු රැකියා 1500 ක් පමණ ජනනය කිරීමට අපේක්ෂා කර තිබුණද. කර්මාන්ත 16 කින් රැකියා 388 පමණක් උත්පාදනය කර තිබුණි.

### 3.1.4 ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම

(අ) බට අත කර්මාන්තපුරය හම්බන්තොට දිස්ත්‍රික්කයේ අක්කර 105 ක ඉඩම් ප්‍රමාණයක් රු.මිලියන 330.93 ක වියදමක් දරා සම පදම් කිරීමේ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා කර්මාන්තපුරයක් ලෙස සංවර්ධනය කරමින් 1999 වර්ෂයේදී ඉදිකර තිබුණි. එහෙත් මෙම කර්මාන්තපුරයෙන් බැහැර කරන අපද්‍රව්‍ය මුහුදට යොමු කිරීමට යෝජනා වී තිබීම හේතුවෙන් කර්මාන්තපුරය අවට ධීවර ජනතාවගේ විරෝධතා නිසා කර්මාන්තපුරයේ ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණි. 2006 පෙබරවාරි 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කර්මාන්තකරුවන් 15 ක් සඳහා අක්කර 45.625 ක් හා පොදු කටයුතු සඳහා අක්කර 8.72 ක් වෙන් කර තිබුණු අතර අක්කර 25 ක් කර්මාන්තකරුවන් 9 කට ලබා දීමට යෝජනා කර තිබුණි. ඒ අනුව අක්කර 25.655 ක් වන ඉඩම් ප්‍රමාණයක් නිෂ්කාර්යව පැවතුණි.

### 3.1.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

2021 පෙබරවාරි 22 දින අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කළුතර පුලර්ටන් වත්ත කර්මාන්තපුරයේ හෙක්ටයාර 1,946 ක භූමි ප්‍රමාණයක කර්මාන්තපුරය පුළුල් කිරීමේ කටයුතු අත්හිටුවා තිබුණි. නැවත 2022 ඔක්තෝබර් 10 දින කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු ඉටු කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දී තිබුණි. අභ්‍යන්තර මාර්ග පද්ධතිය ඉදිකිරීම සඳහා බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ලබා දී ඇති ඇස්තමේන්තුව රු.මිලියන 76 ක් වූ අතර වැඩ ආරම්භ කිරීම සඳහා සියයට 20 ක් වූ අත්තිකාරම් මුදල ඉක්මවා රු. මිලියන 68.02ක් ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව ගෙවා තිබුණි. දැනට මෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

(අ) අමාත්‍යාංශය සතු ධාවන තත්ත්වයේ නොමැති වාහන 02ක් සහ රුපියල් මිලියන 4.5ක් පිරිවැය වූ එක් වාහනයක් 2022 නොවැම්බර් 04 දින වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට ලබා දී තිබුණ ද එම වාහන වලට අදාලව නිසි පරිදි අයිතිය පැවරීමේ කටයුතු සිදු කර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ආ) වසර 1ත් 4 ත් කාල පරාසයක සිට අලුත්වැඩියාවන් සඳහා පෞද්ගලික ගරාජ වලට යොමු කර තිබූ වාහන 03 ක් අලුත්වැඩියාවන් සිදුකර ධාවනයට එක්කර නොතිබුණි. මෙසේ රඳවා තබා තිබූ එක් වාහනයක් සම්බන්ධයෙන් රු.621,900ක අතිරේක මුදලක් සඳහා වගකීමට බැඳීමට අමාත්‍යාංශයට සිදු වී තිබුණි.

(ඇ) අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා විසින් භාවිතා කරන ලද වාහනයක් 2022 මැයි 09 දින අනතුරකට ලක් වී තිබුණු අතර අලුත්වැඩියා කිරීම සඳහා එහි නියෝජිත ආයතනය විසින් රු.7,507,726 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබූ නමුත් රක්ෂණ ආයතනය විසින් රු. 2,600,000ක මුදලක් පමණක් වන්දි ලෙස අනුමත කර තිබුණි. 2022 ජූලි මස 21 දින සිට, කිසිදු අලුත්වැඩියා කිරීමකින් තොරව මෙම රථය නියෝජිත ආයතනයේ රඳවා තිබුණි.

3.3 පාඩු හා හානි

හිටපු අත්‍යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යවරයාගේ ආරක්ෂක නිල රථය ලෙස භාවිතා කර තිබුණු වාහනය 2021 ජනවාරි 13 දින සිදු වූ හදිසි රිය අනතුරකින් හානියට පත් වී තිබුණු අතර එම අවස්ථාවේ රියදුරු විසින් අනතුර පිළිබඳ රක්ෂණ ආයතනය හා පොලිසිය වෙත දැනුම් දී නොතිබුණි. රක්ෂණ වන්දි ගෙවීම රක්ෂණ ආයතනය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව රු.1,323,900 ක් වූ වාහන අළුත්වැඩියා වියදමින් රක්ෂණ වන්දිය වශයෙන් ලද රු.200,000 අඩු කිරීමෙන් පසු ඉතිරි මුදල වන රු.1,123,900 ක් අමාත්‍යාංශයෙන් ගෙවීම් කර තිබුණි. ඒ අනුව මෙම වාහන අනතුර සම්බන්ධයෙන් සිදු වූ රු.1,123,900ක අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බස්නාහිර පළාත තුල පිහිටි කර්මාන්තපුර 7ක කර්මාන්තකරුවන් 64 ක් කිසිදු නිෂ්පාදන කටයුත්තක් සිදු නොකර කර්මාන්තශාලා වසා දැමීම හේතුවෙන් හා තමන් ලබාගත් ඉඩම් සම්පූර්ණයෙන් භාවිතා නොකිරීම හේතුවෙන් කර්මාන්තකරුවන්ට ලබා දී තිබුණු පර්චස් 6624.05 ක (අක්කර 41.4 ක් පමණ) ඉඩම් ප්‍රමාණයක් 2022

දෙසැම්බර් 31 දින වන විට උපයෝජනය නොවී පැවතියද ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) කර්මාන්තකරුවන් වෙත ඉඩම් වෙන්කිරීමේදී නිකුත් කරනු ලබන ඉඩම් වෙන් කිරීමේ ලිපියට අනුව ඉඩම වෙන් කිරීමෙන් පසුව අවුරුදු 35 ක දීර්ඝකාලීනව බදු ගිවිසුමක් අත්සන් කල යුතු වුවද කර්මාන්තපුර 33කින් උලපනේ , නාලන්ද (මාතලේ) හා බස්නාහිර පළාත තුල පිහිටි කර්මාන්තපුර 08 ක් වශයෙන් කර්මාන්තපුර 10 කට අදාලව ලබාදුන් තොරතුරු අනුව කර්මාන්තකරුවන් 101 ක් සඳහා බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ඇ) කර්මාන්තපුර 03 කට අදාලව කර්මාන්තකරුවන් 41ගෙන් අයවිය යුතු බදු මුදල රු.118,828,956 ක් වුවද එම මුදල් අයකිරීම සම්බන්ධව අමාත්‍යාංශය මැදිහත් වී කටයුතු නොකිරීම මත රජයට එම ආදායම් අහිමි වී තිබුණි. තවද, කර්මාන්තපුර 33න් කර්මාන්තපුර 30කට අදාලව හිඟ බදු මුදල් සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කර නොතිබු බැවින් එම කර්මාන්තපුර 30ට අදාලව හිඟ බදු පවතීද යන්න පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ඈ) 2022 වර්ෂය සඳහා වූ අයවැය යෝජනා අනුව ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමෙන් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කලාප ස්ථානගත කිරීම හා නව ව්‍යවසායකයින් සඳහා ව්‍යාපාර සංවර්ධනය වෙනුවෙන් ආයෝජන අවස්ථා ලබාදීමේ ජාතික ව්‍යාපෘතිය යටතේ කර්මාන්තපුර 10 ක් ස්ථාපිත කිරීමට යෝජනා කර ඒ් සඳහා 2022 වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තු අනුව ඒ සඳහා රු.මිලියන 100 ක් වෙන් කර තිබුණි. යෝජිත කර්මාන්තපුර 10 න් කර්මාන්තපුර 4 ක වැඩ කටයුතු 2022 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර වැල්ලවාය කර්මාන්තපුරයක් ඉදිකිරීමට ඇස්තමේන්තු කර නොතිබුනද වැල්ලවාය කර්මාන්තපුරයේ ඉඩම් කොටස් කිරීම හා වැට හා ගේට්ටු ඉදිකිරීම වෙනුවෙන් 2022 වර්ෂයේදී රු.8,288,173 ක වියදම් දරා තිබුණි. මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල කර්මාන්තපුරයක් දැනටත් ස්ථාපිත කර ඇති බැවින් හා එම කර්මාන්තපුරයේ ඉඩම් වෙන් කර දුන් කර්මාන්තකරුවන් 17 න් වර්තමානය වන විට කර්මාන්තකරුවන් 5 ක් පමණක් සාර්ථකව නිෂ්පාදන කටයුතු සිදු කරන බැවින් වැල්ලවාය ප්‍රදේශයේ තවත් කර්මාන්තපුරයක් ඉදිකිරීම වෙනුවට බුත්තල දැනටමත් ඉදිකර පවතින කර්මාන්තපුරය සංවර්ධනය කර කර්මාන්තකරුවන් නගා සිටුවීමට කටයුතු කිරීම සුදුසු බව නිරීක්ෂණය කෙරේ.

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 කාර්ය මණ්ඩලය

2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 668 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 660 ක් විය. ඒ අනුව පුරප්පාඩු 77 ක්ද අතිරික්ත 69 ක්ද නිරීක්ෂණය විය. එනම් ජ්‍යෙෂ්ඨ, තෘතිය, ද්විතිය හා ප්‍රාථමික මට්ටම්වල පිලිවෙලින් 12, 02, 42 ක් හා 21 වශයෙන් පුරප්පාඩු පැවති අතර ද්විතිය මට්ටමේ අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරීන් 44 ක් සහ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංවර්ධන නිලධාරීන් 25 ක්ද අතිරික්තව සිටී.

යූ.එන් අලුත්ගේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට